198 වන කාණ්ඩය - 11 වන කලාපය
தொகுதி 198 - இல. 11
**Volume 198 - No. 11**

2011 අප්‍රේල් 27 වන බදාදා
2011 ஏப்பிரல் 27, புதன்கிழமை
**Wednesday, 27th April, 2011**

# පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES

(HANSARD)

## නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**නිවේදන:**
සේවානියුක්තයන්ගේ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අරමුදල් පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක්

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු**

**පළිබෝධ නාශක පාලනය කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත:**
පළමුවන වර කියවන ලදී

**පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්:**
ශ්‍රී ලංකා ධීවර හා ජලජ සම්පත් සංගමය (සංස්ථාගත කිරීමේ) – [ගරු වික්ටර් ඇන්ටනී මහතා] - පළමුවන වර කියවන ලදී

**කල් තැබීමේ යෝජනාව:**
පාසල් නිල ඇඳුම් රෙදි කඩිනමින් ලබා දීම

---

# பிரதான உள்ளடக்கம்

**அறிவிப்புக்கள்:**
ஊழியர் ஓய்வூதிய நன்மைகள் நிதியச் சட்டமூலம்: உயர் நீதிமன்றுக்கு மனு

**வினாக்களுக்கு வாய்மூல விடைகள்**

**பீடைகொல்லிகளைக் கட்டுப்படுத்தல் (திருத்தம்) சட்டமூலம்:**
முதன்முறை மதிப்பிடப்பட்டது

**தனி உறுப்பினர் சட்டமூலங்கள்:**
கடற்றொழில், நீர்வாழ், உயிரின வளங்களுக்கான இலங்கை அவை (கூட்டிணைத்தல்) – [மாண்புமிகு விக்டர் அன்ரனி]– முதன்முறை மதிப்பிடப்பட்டது

**ஒத்திவைப்புப் பிரேரணை:**
பாடசாலை சீருடைத் துணிகளைத் துரிதமாகப் பெற்றுக்கொடுத்தல்

---

# PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:
Employees' Pension Benefits Fund Bill: Petition to the Supreme Court

ORAL ANSWERS TO QUESTIONS

CONTROL OF PESTICIDES (AMENDMENT) BILL:
Read the First time

PRIVATE MEMBERS' BILLS:
Sri Lanka Association for Fisheries and Aquatic Resources (Incorporation) – [The Hon. Victor Antony] – Read the First time

ADJOURNMENT MOTION:
Immediate Provision of School Uniform Material

# පාර්ලිමේන්තුව
## பாராளுமன்றம்
## PARLIAMENT

***2011 අප්‍රේල් 27 වන බදාදා***
***2011 ஏப்பிரல் 27, புதன்கிழமை***
*Wednesday, 27th April, 2011*

***අ. භා. 1.00ට පාර්ලිමේන්තුව රැස් විය. නියෝජ්‍ය කථානායකතුමා [ගරු චන්දිම වීරක්කොඩි මහතා] මූලාසනාරූඪ විය.***

*பாராளுமன்றம் பி.ப. 1.00 மணிக்குக் கூடியது. பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு சந்திம வீரக்கொடி] தலைமை வகித்தார்கள்.*

*The Parliament met at 1.00 p.m.,* MR. DEPUTY SPEAKER [THE HON. CHANDIMA WEERAKKODY] *in the Chair.*

## නිවේදන
## அறிவிப்புக்கள்
## ANNOUNCEMENTS

### සේවානියුක්තයන්ගේ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අරමුදල් පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක්
### ஊழியர் ஓய்வூதிய நன்மைகள் நிதியச் சட்டமூலம்: உயர் நீதிமன்றுக்கு மனு
### EMPLOYEES' PENSION BENEFITS FUND BILL: PETITION TO THE SUPREME COURT

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) ව්‍යවස්ථාව ප්‍රකාරව "සේවානියුක්තයන්ගේ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අරමුදල්" නමැති පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද පෙත්සමක පිටපතක් ගරු කථානායකතුමා වෙත ලැබී ඇති බව ස්ථාවර නියෝග අංක 50(2)(අ) යටතේ පාර්ලිමේන්තුවට දැන්වීමට කැමැත්තෙමි.

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (2) වැනි ඡේදය සමඟ කියවිය යුතු 1996 අංක 27 දරන පනතින් සංශෝධිත 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතේ 22උ වගන්තිය යටතේ සෙස් බදු සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් පනවන ලදුව, 2010 දෙසැම්බර් 27 දිනැති අංක 1686/4 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නියමය; සහ

2009 වර්ෂය සඳහා වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව. - [ගරු දි.මු. ජයරත්න මහතා]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு தினேஷ் குணவர்தன - நீர்வழங்கல், வடிகாலமைப்பு அமைச்சரும் அரசாங்கத் தரப்பின் முதற்கோலாசானும்)
(The Hon. Dinesh Gunawardena - Minister of Water Supply and Drainage and Chief Government Whip)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යතුමා වෙනුවෙන් මම 2009 වර්ෂය සඳහා රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ගරු මහින්ද සමරසිංහ මහතා - පැමිණ නැත.

ගරු පියසේන ගමගේ මහතා - පැමිණ නැත.

**ගරු රෙජිනෝල්ඩ් කුරේ මහතා (සුළු අපනයන භෝග ප්‍රවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரெஜினோல்ட் குரே - சிறு ஏற்றுமதிப் பயிர்கள் ஊக்குவிப்பு அமைச்சர்)
(The Hon. Reginold Cooray -Minister of Minor Export Crop Promotion)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම වාද්දුව, දුම්රිය නිල නිවාස, අංක 21/3 දරන ස්ථානයේ පදිංචි ඒ.ඩබ්ලිව්. නිමල් කුමාර මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ගරු ඩිලාන් පෙරේරා මහතා - පැමිණ නැත.

ගරු ජගත් බාලසූරිය මහතා - පැමිණ නැත.

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා - පැමිණ නැත.

**ගරු වාසුදේව නානායක්කාර මහතා (ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார - தேசிய மொழிகள், சமூக ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Vasudeva Nanayakkara - Minister of National Languages and Social Integration)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) ඇඹිලිපිටිය, මොරකැටිය, ග්‍රාමීය මධ්‍යස්ථානය, අංක 45 දරන ස්ථානයේ පදිංචි ඩබ්ලිව්.වී.එෆ්. විජේවීර මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) මාම්පේ, පිළියන්දල, පී.එස්. සිල්වා මාවත, අංක 103 දරන ස්ථානයේ පදිංචි පී.එල්.එස්. පෙරේරා මහතාගෙන් ලැබුණු පෙත්සම.

**ගරු සී.පී.ඩී. බණ්ඩාරනායක මහතා (දේශීය වෛද්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சீ.பீ.டி. பண்டாரநாயக்க - சுதேச மருத்துவத்துறை பிரதி அமைச்சர்)
(The Hon. C.P.D. Bandaranaike - Deputy Minister of Indigenous Medicine)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් හතර පිළිගන්වමි.

(1) වතුරුගම, අමුණුකුඹුර, අංක 16/28 දරන ස්ථානයේ පදිංචි වත්සලා මදුමාදිරි පතිරගේ මෙනෙවියගෙන් ලැබුණු පෙත්සම;

(2) කල්එළිය, රද්දල්ගොඩ පදිංචි සෝමපාල වීරක්කොඩි මහතාගෙන් ලැබුණු පෙත්සම;

(3) ගණේමුල්ල, ඉහළ යාගොඩ, අංක 106/ජේ. දරන ස්ථානයේ පදිංචි ඩබ්ලිව්.ඒ. නිරෝෂා සුභාෂිනී මෙනෙවියගෙන් ලැබුණු පෙත්සම; සහ

(4) ගම්පහ, මාදෙල්ගමුව, අංක 200/3 දරන ස්ථානයේ පදිංචි කේ.ඒ.ජේ. පෙරේරා මහතාගෙන් ලැබුණු පෙත්සම.

**ගරු නිර්මල කොතලාවල මහතා (වරාය හා මහාමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல - துறைமுகங்கள், நெடுஞ்சாலைகள் பிரதி அமைச்சர்)
(The Hon. Nirmala Kotalawala - Deputy Minister of Ports and Highways)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් තුන පිළිගන්වමි.

(1) කළුතර උතුර, නීග්‍රෝධාරාම පාර, අංක 08 දරන ස්ථානයේ පදිංචි බී.එස්.එස්.ජේ. ප්‍රනාන්දු මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) නෑබොඩ, වරකාගොඩ, උයන්වත්ත, අංක 90/1 දරන ස්ථානයේ පදිංචි නෙවිල් දිලීප් කුමාර කහටපිටිය මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(3) බත්තරමුල්ල, බටපොත, නුගේදෙණිය පාර, අංක 364/5 දරන ස්ථානයේ පදිංචි එස්.ඒ.සී. ජයන්තිමාලා මහත්මියගෙන් ලැබුණු පෙත්සම.

**ගරු ලලිත් දිසානායක මහතා (සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு லலித் திசாநாயக்க - சுகாதார பிரதி அமைச்சர்)
(The Hon. Lalith Dissanayake - Deputy Minister of Health)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම අරණායක, ගැටබේරිය, ජී./10 දරන ස්ථානයේ පදිංචි ඒ.එම්.පී.එම්. හුසෙයින් මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ගරු කරු ජයසූරිය මහතා - පැමිණ නැත.

ගරු ගයන්ත කරුණාතිලක මහතා - පැමිණ නැත.

ගරු චන්ද්‍රානි බණ්ඩාර ජයසිංහ මහත්මිය - පැමිණ නැත.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා - පැමිණ නැත.

ගරු අජිත් කුමාර මහතා - පැමිණ නැත.

**ගරු වික්ටර් ඇන්ටනි මහතා**
(மாண்புமிகு விக்டர் அந்தனீ)
(The Hon.Victor Antony)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම හලාවත, වීවර්ස් පාර, අංක 43/2බී. දරන ස්ථානයේ පදිංචි වී. රත්නසිරි පෙරේරා මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

**ගරු වී.කේ. ඉන්දික මහතා**
(மாண்புமிகு வி.கே. இந்திக)
(The Hon.V.K. Indika)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ලුණුගම්වෙහෙර, නව නගරය, "මිහිර" නිවසෙහි පදිංචි වී.ජී. වසන්තා චන්ද්‍රානි මහත්මිය ඇතුළු 9 දෙනකුගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ගරු අජිත් පී. පෙරේරා මහතා - පැමිණ නැත.

**ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය**
(மாண்புமிகு (வைத்திய கலாநிதி)(திருமதி) சுதர்ஷினி பர்னாந்துபுள்ளே)
(The Hon. (Dr.) (Mrs.) Sudharshini Fernandopulle)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) කොටුගොඩ, සියඹලාපිටිය, "ශ්‍රියානි" නිවසෙහි පදිංචි ටී.යූ.කේ. ඒකනායක මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) රාගම, වල්පොල, උග්ගස්හේන, අංක 3 බී. දරන ස්ථානයේ පදිංචි එම්. ජයසේන මහතාගෙන් ලැබුණු පෙත්සම.

**ගරු රුවන් රණතුංග මහතා**
(மாண்புமிகு ருவன் ரணதுங்க)
(The Hon. Ruwan Ranatunga)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම අඹන්පොල, ඇල්ලබඩගම පදිංචි ජේ.එම්. අමරසිංහ මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ගරු රොෂාන් රණසිංහ මහතා - පැමිණ නැත.

**ගරු විදුර වික්‍රමනායක මහතා**
(மாண்புமிகு விதுர விக்கிரமநாயக்க)
(The Hon. Vidura Wickramanayaka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) පොල්ගස්ඕවිට, කහතුඩුව, පරණ පොලීසිය පාර, අංක 132 දරන ස්ථානයේ පදිංචි බී.ඒ.ඩී.සී.ජී. ජයතිලක මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) ගල්පාත, බටගොඩ, අංක 24 දරන ස්ථානයේ පදිංචි ජී. ජනක රවීන්ද්‍ර මහතාගෙන් ලැබුණු පෙත්සම.

**ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් තුන පිළිගන්වමි.

(1) මහනුවර, උඩුව, අදිකාරම්පුර, අංක 97 දරන ස්ථානයේ පදිංචි කුසුම් සමරතුංග මහත්මිය හා පී.පී. සමරතුංග මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) අම්පාර, නව නගරය, එල්. 190 දරන ස්ථානයේ පදිංචි ඒ. ගුරුසිංහ මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(3) අම්පාර, මිහිඳුපුර, සී. 563/එෆ්. දරන ස්ථානයේ පදිංචි කේ.එම්. උපුල් ශාන්ත මහතාගෙන් ලැබුණු පෙත්සම.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු රෝසි සේනානායක මහත්මිය - පැමිණ නැත.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 1-0456/’10-(3), ගරු රවි කරුණානායක මහතා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඒ ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு தினேஷ் குணவர்தன - நீர்வழங்கல், வடிகாலமைப்பு அமைச்சரும் அரசாங்கத் தரப்பின் முதற்கோலாசானும்)
(The Hon. Dinesh Gunawardena - Minister of Water Supply and Drainage and Chief Government Whip)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති තුනක් කල් ඉල්ලනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු ඇමතිතුමනි, හතරවැනි වතාවට තමයි මම මේ ප්‍රශ්නය අහන්නේ. එතරම් අදක්ෂ ආණ්ඩුවක්ද තිබෙන්නේ?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
අදක්ෂකමක් නොවෙයි. එම ප්‍රශ්නයෙන් රටේ ලෝකේ හැම තැනම විස්තර ඉල්ලනවා. එක තැනක නිශ්චිත විස්තරයක් ඉල්ලුවා නම් පිළිතුර දිය හැකියි. ලංකාවේ හැම තැනම විස්තර ඉල්ලන කොට ඒවා පිළිබඳව සොයා බලා පිළිතුර දෙන්නට ඕනෑ. ඒක ආණ්ඩුවේ අදක්ෂකම නොවෙයි, තමුන් ප්‍රශ්නය අසන ක්‍රමයේ අදක්ෂකම. ප්‍රශ්නය හරියට ඉලක්කයට අහන්න. නිකම් කතන්දරයක් ඇහුවාම ඒ කතන්දරයටම උත්තර දෙන්න ඕනෑ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
නිකම් කෑ ගැහුවාට වැඩක් නෑ. හය වෙන්න එපා. ප්‍රශ්නයට පිළිතුරු දෙන්න. බොරුවට ශබ්ද කරනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඔබතුමා කෑ ගැහුවාට හය වෙන්නෙත් නැහැ. ඒක තේරුම් ගන්න. [බාධා කිරීම්]

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 3-0800/’10-(2), ගරු බුද්ධික පතිරණ මහතා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඒ ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සතියක් කල් ඉල්ලනවා. මොකද, එම ප්‍රශ්නය අධ්‍යාපන ඇමතිතුමා සිටින වෙලාවක අහනවා නම් ඔබතුමාට වාසියි.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

### "නිල සෙවන" නිවාස ව්‍යාපෘතිය: නිවාස සංඛ්‍යාව
### "நில செவன" வீடமைப்புத் திட்டம்: வீடுகளின் எண்ணிக்கை
### "NILA SEVANA" HOUSING PROJECT: NUMBER OF HOUSES

0988/’10

5. **ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) රාජ්‍ය සේවකයන් වෙත නිවාස ලබා දීම සඳහා “නිල සෙවන” නමින් නිවාස ව්‍යාපෘතියක් රාගම නගරය ආශ්‍රිතව ඉදි කිරීමට පියවර ගනු ලැබුවේද;

(ii) එසේ නම්, එය ආරම්භ කළ දිනය කවරේද;

(iii) යෝජිත නිවාස ව්‍යාපෘතිය මඟින් ඉදි කිරීමට සැලසුම් කරන ලද නිවාස සංඛ්‍යාව කොපමණද;

(iv) දැනට එම ව්‍යාපෘතියේ වැඩ ආරම්භ කර ඇත්නම්, මේ වන විට ඉදි කිරීම් අවසන් කර ඇති නිවාස සංඛ්‍යාව කවරේද;

(v) එකී නිවාස ව්‍යාපෘතියේ වැඩ අවසන් කිරීමට යෝජිත දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

நிர்மாண, பொறியியல் சேவைகள், வீடமைப்பு, பொது வசதிகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) அரசாங்க ஊழியர்களுக்கு வீடு வழங்குவதற்காக "நில செவன" எனும் வீடமைப்புத் திட்டத்தை ராகம நகர்ப் பிரதேசத்தில் நிர்மாணிக்க நடவடிக்கை எடுக்கப்பட்டதா என்பதையும்,

(ii) ஆமெனில், அது ஆரம்பிக்கப்பட்ட திகதி யாதென்பதையும்,

(iii) உத்தேச வீடமைப்பு திட்டம் மூலம் நிர்மாணிக்க திட்டமிடப்பட்டுள்ள வீடுகளின் எண்ணிக்கை எவ்வளவு என்பதையும்,

(iv) தற்போது மேற்படி கருத்திட்டம் ஆரம்பிக்கப்பட்டிருப்பின் இதுவரை நிர்மாணித்து முடிக்கப்பட்டுள்ள வீடுகளின் எண்ணிக்கை எவ்வளவு என்பதையும்,

(v) மேற்படி வீடமைப்புத் திட்டத்தின் வேலைகளை பூர்த்தி செய்ய உத்தேசித்துள்ள திகதி என்னவென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Construction, Engineering Services, Housing and Common Amenities:

(a) Will he state-

(i) whether steps were taken to build a housing project named "Nila Sevana" close to Ragama town for the purpose of providing houses for Public sector employees ;

(ii) if so, the date on which it was commenced ;

(iii) the number of houses that have been planned to be built under the proposed housing project ;

(iv) if the construction work of the aforesaid project has already been started the number of houses of which construction work has been completed by now ; and

(v) the proposed date by which the construction work of the aforesaid housing project will be completed?

(b) If not, why?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශය මඟින් රාගම නගරය ආශ්‍රිතව "නිල සෙවන" නමින් නිවාස ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර නොමැත.

(ii) අදාළ නොවේ.

(iii) අදාළ නොවේ.

(iv) අදාළ නොවේ.

(v) අදාළ නොවේ.

(ආ) අදාළ නොවේ.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අදාළ ඇමතිතුමා ඇවිල්ලා ඉන්නවා. ගරු ඇමතිතුමනි, -

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

පළමුවන අතුරු ප්‍රශ්නය.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

ගරු ඇමතිතුමනි, තමුන්නාන්සේලා ප්‍රකාශයක් කරලා තිබුණා රාගම නගරය ආශ්‍රිතව රජයේ සේවකයින්ට නිල නිවාස ඉදි කරනවා කියලා. ඒ පිළිබඳවයි මේ ප්‍රශ්නය නඟලා තිබෙන්නේ. අපි දැන ගන්න කැමැතියි මෙය ක්‍රියාත්මක වනවාද, නැද්ද කියලා.

**ගරු විමල් වීරවංශ මහතා (ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு விமல் வீரவங்ச - நிர்மாண, பொறியியல் சேவைகள், வீடமைப்பு, பொது வசதிகள் அமைச்சர்)
(The Hon. Wimal Weerawansa - Minister of Construction, Engineering Services, Housing and Common Amenities)

කොයි කාලයේ, කවුරු කරපු ප්‍රකාශයක් ගැනද ඔබතුමා අහන්නේ?

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

මගේ ප්‍රශ්නයේ නම් විස්තර සඳහන් කරලා තිබෙනවා. මට දින වකවානු මතක නැහැ. නමුත් තමුන්නාන්සේලා මැතිවරණ කාලයේ රජයේ සේවකයින්ට දීපු පොරොන්දු වෙන්න ඇති.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

"තමුන්නාන්සේලා" කිව්වාම ගොඩක් නේ?

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

දීපු පොරොන්දුත් දැන් මතක නැහැ නේ. ඒක නේ කනගාටුදායක තත්ත්වය.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

ගරු මන්ත්‍රීතුමනි, මෙහෙම පොරොන්දුවක් දීලා නැහැ. මේකේ ඇත්ත තත්ත්වය මේකයි. මම ඔබතුමාට ඒක පැහැදිලි කරන්නම්. "නිල සෙවන" නිවාස ව්‍යාපෘතියක් සඳහා ශ්‍රී ලංකා ඉඩම් ගොඩ කිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව සතු ඉඩම් ලබා ගැනීම සඳහා රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය නාගරික සංවර්ධන හා ජලාපවහන අමාත්‍යාංශය ඒකාබද්ධව 2006.07.18 දිනැතිව අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කරලා තිබෙනවා. ඊට පසුව 2008.05.28 වන දින අරලියගහ මන්දිරයේදී ආයෝජන ප්‍රවර්ධන සම්බන්ධව පැවැති කැබිනට් අනු කාරක සභාවේදී කැලණිය සහ රාගම පිහිටි එකී සංස්ථාව සතු ඉඩම් කොටස්ද මෙම ව්‍යාපෘතිය සඳහා නිදහස් කිරීමට අනුමැතිය ලැබී තිබෙනවා. ඒ අනුව ඉඩම් ගොඩ කිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව සතු රාගම පිහිටි අක්කර 5ක ඉඩම් ප්‍රමාණය ලබා දීමට කැබිනට් අනුමැතිය ලැබී තිබෙනවා. එහෙම වුණත් ඒ ව්‍යාපෘතිය

සම්බන්ධයෙන් අවසානයේදී රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම් විසින් රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇමතූ 2010.05.10 දිනැති ලිපියෙන් දැනුම් දී තිබෙනවා, යෝජිත ඉඩමේ මධ්‍යම පාන්තිකයන් සඳහා -රජයේ සේවකයන්ද ඇතුළුව- නිවාස යෝජනා ක්‍රමයක් ඉදි කිරීම සඳහා නාගරික සංවර්ධන අමාත්‍යතුමා විසින් 2008.10.29 වන දින කැබිනට් මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කර ඇති බවත්, එමඟින් ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව සහ වින්කොන් සමාගම අවබෝධතා ගිවිසුමක් අත්සන් කොට මධ්‍යම පන්තිය සඳහා -රජයේ සේවකයන් ඇතුළුව- නිවාස ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල තීරණයෙන් අනුමැතිය ලැබී ඇති බවත්. ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව මුලින් එකඟ වුණේ රජයේ සේවකයන් සඳහා නිවාස ව්‍යාපෘතියකට ඉඩම දෙන්න නිසා -පසුව එය මධ්‍යම පාන්තිකයනුත් ඇතුළුව රජයේ සේවකයන් සඳහා වින්කොන් සමාගමත් සමඟ කෙරෙන ඒකාබද්ධ ව්‍යාපෘතියක් නිසා- ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව මේ ඉඩම ඒ කටයුත්තට නිදහස් කරන්න බැරි බව පසුව දැනුම් දීලා තිබෙනවා. ඊට පසුව මෙම "නිල සෙවන" ව්‍යාපෘතිය ඍජුවම රාජ්‍ය සේවක නිවාස ව්‍යාපෘතියක් නොවන බැවින් යෝජිත ඉඩම එකී ව්‍යාපෘතියට ලබා දීම සම්බන්ධයෙන් ඉදිරි කටයුතු නොකරන බව රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම්තුමා ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත දැනුම් දී තිබෙනවා.

මේක කරන්නේ අපේ අමාත්‍යාංශයෙන් නොවෙයි. මේක මීට කලින් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය හරහා දියත් වුණු ක්‍රියාවලියක්. එවකට තිබුණු නාගරික සංවර්ධන හා පූජා භූමි සංවර්ධන අමාත්‍යාංශයත් මේකට මැදිහත් වෙලා තිබෙනවා. කොහොම වුණත් මධ්‍යම පාන්තිකයන් සඳහා පෞද්ගලික අංශයත් ඒකාබද්ධ වෙලා කරන ව්‍යාපෘතියක් නිසා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව මේ ඉඩම ඒ කටයුත්තට දෙන එක නතර කර තිබෙනවා. ඒ නිසා "නිල සෙවන" නමින් නිවාස ව්‍යාපෘතියක් රාගම නගරය ආශ්‍රිතව මෙතෙක් ක්‍රියාත්මක කර නැහැ. මේක තමයි ඇත්ත තත්ත්වය.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
දෙවන අතුරු ප්‍රශ්නය.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
වෙනත් විකල්ප ස්ථානයක ක්‍රියාත්මක කරන්න සූදානම් කර තිබෙනවාද?

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු මන්ත්‍රීතුමනි, මා දැනුවත්ව මේ ව්‍යාපෘතිය වෙනත් විකල්ප ස්ථානයක ක්‍රියාත්මක කිරීමේ අදහසකුත් නැහැ. නමුත් මේක ඇත්තටම ඔබතුමා ඇසිය යුතුව තිබෙන්නේ රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයෙන්.

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා (සමාජ සේවා අමාත්‍යතුමා)**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா - சமூக சேவைகள் அமைச்சர்)
(The Hon. Felix Perera - Minister of Social Services)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, -

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
තුන්වන අතුරු ප්‍රශ්නය. ගරු ෆීලික්ස් පෙරේරා ඇමතිතුමා.

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
මේක මගේ ආසනයේ කරන දෙයක්. මන්ත්‍රීතුමා කියන්නේ මේක එපා කියලාද?

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
මා එපා කියන්නේ නැහැ. මේක කරන්නේ නැති එක ගැනයි පැමිණිල්ල.

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
අපි කරන්නම්. භය වන්න එපා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 7 -1026/'10- (1), ගරු සජිත් ප්‍රේමදාස මහතා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා (මුදල් හා ක්‍රම සම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன - நிதி, திட்டமிடல் பிரதி அமைச்சர் )
(The Hon. Gitanjana Gunawardena - Deputy Minister of Finance and Planning)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 8 -0475/'10- (2), ගරු රවි කරුණානායක මහතා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 10 -0801/'10-(2), ගරු බුද්ධික පතිරණ මහතා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා ඒ ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සතියක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 12 -1027/'10-(1), ගරු සජිත් ප්‍රේමදාස මහතා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා ඒ ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## සිගරට් සහ මද්‍යසාර: ආදායම
## சிகரெட் மற்றும் மதுபானம்: வருமானம்
## CIGARETTES AND ALCOHOL: REVENUE

0476/'10

13. **ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) පසු ගිය වර්ෂ 10ක කාලය තුළ එක් එක් වර්ෂයේදී සිගරට් සහ මද්‍යසාරවල මිල වැඩි කරනු ලැබූ දිනයන් සහ ප්‍රමාණයන් කවරේද;

(ii) සිගරට් සහ මද්‍යසාරවල මිල වැඩි කළ එම එක් එක් අවස්ථාවේදී පෙර පැවැති මිලට වඩා වැඩියෙන් නියම කළ මිල ගණන් හේතුවෙන් උපයා ගත් සමස්ත ආදායම වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මිල වැඩි කිරීම මඟින් සිගරට් හා මද්‍යසාර භාවිතය අධෛර්යවත් කිරීමට රජය උනන්දුවක් දක්වන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) සිගරට් සහ මද්‍යසාර සඳහා පනවා ඇති සියලු බදු වර්ග කවරේද යන්න එතුමා වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්නෙහිද?

(ඈ) නො එසේ නම් ඒ මන්ද?

நிதி, திட்டமிடல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கடந்த 10 வருடங்களில் சிகரெட் மற்றும் மதுபானம் ஆகியவற்றின் விலைகள் எப்போது எந்தளவில் அதிகரிக்கப்பட்டன என்பதை வருடாந்த அடிப்படையிலும்,

(ii) சிகரெட் மற்றும் மதுபானம் ஆகியன முன்னைய விலையிலிருந்து கூட்டப்பட்ட ஒவ்வொரு முறையும் அதன்மூலம் ஈட்டப்பட்ட மொத்த வருமானத்தை வெவ்வேறாகவும்

அவர் அறியத்தருவாரா?

(ஆ) விலைகளை அதிகரிப்பதன் மூலம் சிகரெட் மற்றும் மதுபானம் ஆகியவற்றின் பாவனையைக் குறைக்கத் தூண்டுவதற்கு அரசாங்கம் ஆர்வங்கொண்டுள்ளதா என்பதை அவர் கூறுவாரா?

(இ) சிகரெட் மற்றும் மதுபானம் ஆகியவற்றிற்கு விதிக்கப்பட்ட சகல வரிகளையும் தனித்தனியாக அவர் தெரிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Finance and Planning:

(a) Will he inform-

(i) as to when and in what extent the prices of cigarettes and alcohol have been increased for the last 10 years on per year basis; and

(ii) the total revenue earned in each occasion, owing to the increase over the previous rate separately, for cigarettes and alcohol?

(b) Will he state whether the Government is interested to discourage the usage of cigarettes and alcohol through the increase of prices?

(c) Will he also state all the taxes imposed on cigarettes and alcohol, separately?

(d) If not, why?

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම පිළිතුරේ දත්ත තුන්සිය විසි ගණනක් තිබෙන නිසා මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை:*
** Answer tabled:*

(අ) (i) **මද්‍යසාර**

පසු ගිය වර්ෂ 10 කාලය තුළ මද්‍යසාරවල මිල වැඩි කළ දිනයන් සහ ප්‍රමාණයන් පහත දැක්වේ :

| මිල වැඩි වූ වර්ෂය හා දිනය | මොලැසස් (සම්මත ලීටරයකට) රු. | කල් (සම්මත ලීටරයකට) රු. | පොල් හා පදම් කළ (සම්මත ලීටරයකට) රු. | ධාන්‍යමය මත්පැන් සැර 5% ට අඩු (තොග ලීටරයකට) රු. | ධාන්‍යමය මත්පැන් සැර 5% හෝ ඊට වැඩි (තොග ලීටරයකට) රු. | වයින් (සම්මත ලීටරයකට) රු. | විදේශ මත්පැන් (සම්මත ලීටරයකට) රු. | බෝතල් රා (තොග ලීටරයකට) රු. |
|---|---|---|---|---|---|---|---|---|
| 2000.05.09 | 197.00 | 197.00 | 213.00 | - | - | - | 247.00 | - |
| 2002.03.22 | 299.00 | 299.00 | 299.00 | - | - | - | 399.00 | - |
| 2003.11.20 | 351.00 | 351.00 | 351.00 | 22.50 | 38.50 | 190.00 | 470.00 | - |
| 2004.11.19 | 366.00 | 366.00 | 366.00 | 27.50 | 43.50 | 200.00 | 490.00 | - |
| 2005.11.09 | 381.00 | 381.00 | 381.00 | 32.50 | 48.50 | 225.00 | 510.00 | - |
| 2005.12.19 | 396.00 | 396.00 | 396.00 | 37.50 | 53.50 | 250.00 | 525.00 | - |
| 2006.10.05 | 421.00 | 421.00 | 421.00 | - | - | 275.00 | 550.00 | - |
| 2007.03.13 | 446.00 | 446.00 | 446.00 | - | - | 300.00 | 575.00 | 10.00 |
| 2007.10.25 | 510.00 | 510.00 | 510.00 | 38.00 | 54.00 | 365.00 | 640.00 | - |
| 2008.10.07 | 560.00 | 560.00 | 560.00 | 48.00 | 64.00 | 415.00 | 690.00 | - |
| 2009.03.27 | 610.00 | 610.00 | 610.00 | - | - | 465.00 | 740.00 | - |
| 2010.06.24 | 660.00 | 660.00 | 660.00 | 58.00 | 74.00 | 515.00 | 790.00 | - |
| 2010.10.29 | 710.00 | 710.00 | 710.00 | 63.00 | 79.00 | 565.00 | 840.00 | - |
| 2010.11.19 | 813.00 | 813.00 | 813.00 | 80.00 | 96.00 | 668.00 | 953.00 | - |
| 2011.01.05 | 863.00 | 863.00 | 863.00 | 80.00 | 96.00 | 718.00 | 1,003.00 | - |

**සිගරට්**

පසු ගිය වර්ෂ 10 කාලය තුළ සිගරට් මිල වැඩි කළ දිනයන් සහ ප්‍රමාණයන් පහත දැක්වේ:

| සිගරට් මිල සංශෝධනය කරනු ලැබූ වර්ෂය සහ දිනය | සංශෝධනයට අනුව සිගරට් 1000කට නිෂ්පාදන බදු මුදල රු. | | | | |
|---|---|---|---|---|---|
| | මි.මී. 84 ට වැඩි | මි.මී 84 | මි.මී 72 | මි.මී. 67 | මි.මී. 59 |
| 2000.05.10 | 4,824.00 | 4,308.00 | 4,172.00 | 3,142.00 | 2,249.00 |
| 2000.11.17 | 5,156.00 | 4,640.00 | 4,503.00 | - | - |
| 2002.02.14 | - | 4,965.00 | - | - | 1,300.00 |
| 2002.08.01 | - | 4,694.00 | 4,256.000 | 2,970.00 | 1,229.00 |
| 2002.10.18 | 5,228.00 | 5,022.00 | - | - | 1,555.00 |
| 2003.08.26 | 5,500.00 | 5,315.00 | 4,547.00 | - | - |
| 2004.01.01 | 5,800.00 | 5,600.00 | 4,785.00 | 3,137.00 | 1,640.00 |
| 2004.09.25 | 6,150.00 | 5,904.00 | 5,088.00 | - | - |
| 2005.04.09 | 6,460.00 | 6,197.00 | 5,380.00 | 3,430.00 | 1,932.00 |
| 2005.11.09 | 6,770.00 | 6,489.00 | 5,671.00 | 3,722.00 | 2,223.00 |
| 2005.12.09 | 7,020.00 | 6,732.00 | 5,919.00 | - | - |
| 2006.10.09 | 7,306.00 | 7,018.00 | - | - | - |
| 2007.06.07 | 7,588.00 | 7,283.00 | 6,183.00 | - | - |
| 2007.10.12 | 8,588.00 | 8,086.00 | 6,986.00 | - | - |
| 2007.11.08 | 8,868.00 | 8,314.00 | 7,219.00 | 3,712.00 | 2,215.00 |
| 2008.03.15 | 9,870.00 | 8,850.00 | - | 4,520.00 | - |
| 2008.09.16 | 10,870.00 | 9,380.00 | 7,745.00 | 5,048.00 | - |
| 2009.01.01 | 11,170.00 | 9,681.00 | 7,991.00 | 5,215.00 | 2,289.00 |
| 2009.03.27 | 12,170.00 | 10,715.00 | 8,485.00 | 5,706.00 | - |
| 2010.06.24 | 13,170.00 | 11,260.00 | 9,028.00 | 6,246.00 | 2,830.00 |
| 2010.10.29 | 14,360.00 | 11,988.00 | 9,720.00 | 6,893.00 | 3,425.00 |
| 2010.11.23 | 14,400.00 | 12,030.00 | 9,751.00 | 6,922.00 | 3,440.00 |
| 2010.12.31 | 15,000.00 | 12,108.00 | 9,811.00 | 6,973.00 | 3,465.00 |

(iii) මද්‍යසාරවල මිල වැඩි කළ එම එක් එක් අවස්ථාවේදී පෙර පැවති මිලට වඩා වැඩියෙන් නියම කළ මිල ගණන් හේතුවෙන් උපයා ගත් සමස්ත ආදායම වෙන් වෙන් වශයෙන් ගණනය කොට නොමැති අතර දේශීය වශයෙන් නිෂ්පාදනය කිරීමේ දී අය කරනු ලැබූ මුළු සුරා බදු ආදායම වාර්ෂිකව පහත පරිදි වේ:

මුළු සුරා බදු ආදායම (රු.මිලියන)

| වර්ෂය | ධාන්‍ය මත්පැන් | සැර මත්පැන් | එකතුව |
|---|---|---|---|
| 2000 | 795.50 | 5,356.40 | 6151.90 |
| 2001 | 785.40 | 5,248.50 | 6033.90 |
| 2002 | 824.20 | 8,009.90 | 8834.10 |
| 2003 | 950.90 | 10,068.90 | 11019.80 |
| 2004 | 1,401.60 | 12,446.10 | 13,847.70 |
| 2005 | 1,820.70 | 14,499.70 | 16,320.40 |
| 2006 | 2,108.30 | 18,412.10 | 20,520.40 |
| 2007 | 2,336.20 | 21,492.90 | 23,829.10 |
| 2008 | 2,972.20 | 24,325.40 | 27,297.60 |
| 2009 | 3349.20 | 24,904.80 | 28,254.00 |

සිගරට් මිල වැඩ කිරීම තුළින් එක් එක් වර්ෂයේ උපයා ගත් අමතර ආදායම පහත ආකාර වේ.

| වර්ෂය | මිල වෙනස් වීම නිසා ලැබූ අමතර ආදායම (රු.මිලියන) |
|---|---|
| 2000.05.10 සිට | 135 |
| 2002 | 30 |
| 2003 | 421 |
| 2004 | 307 |
| 2005 | 1,227 |
| 2006 | 209 |
| 2007 | 1,538 |
| 2008 | 2,232 |
| 2009 | 2,712 |
| 2010.10.29 දක්වා | 824 |

(ආ) ඔව්.

(ඇ) **සිගරට් සඳහා පනවා ඇති බදු වර්ග**

දුම්කොළ බද්ද - කිලෝග්‍රෑමයකට රු. 10

එකතු කළ අගය මත බද්ද (වැට් බද්ද) - සියයට 12

ජාතිය ගොඩනැගීමේ බද්ද - සියයට 2

නිෂ්පාදන බද්ද -

| සිගරට් 1000කට නිෂ්පාදන බදු මුදල රු. (2010.12.31 දින වන විට) | | | | |
|---|---|---|---|---|
| මි.මී. 84 ට වැඩි | මි.මී 84 | මි.මී 72 | මි.මී. 67 | මි.මී. 59 |
| 15,000.00 | 12,108.00 | 9,811.00 | 6,973.00 | 3,465.00 |

**මද්‍යසාර සඳහා පනවා ඇති බදු වර්ග**

සුරා බද්ද -

| | සම්මත සැර මත්පැන් ලීටරයකට |
|---|---|
| දේශීය වර්ගයේ | රු. 863.00 |
| මෙරට සෑදූ විදේශීය වර්ගයේ | රු.1,003.00 |

එකතුකළ අගය මත බද්ද (වැට් බද්ද) - සියයට 12

ජාතිය ගොඩනැගීමේ බද්ද - සියයට 2

ආර්ථික සේවා ගාස්තුව - විකුණුම් මිලෙන් සියයට 1

(ඈ) පැන නොනඟී.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
පළමුවන අතුරු ප්‍රශ්නය.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාගේ උත්තරය තුළින් අපට පෙනෙන්නේ, බදු ආදායම් උත්පාදන ක්‍රමයක් ලෙස දැන් "මතට තිත" පාවිච්චි කරන බවයි. ඒ යටතේ සිගරට් සහ අරක්කුවලට සියයට 25ක්, 30ක් බදු පනවන අවස්ථාවේදී ඔබතුමන්ලා අය වැයේ තිබෙන යෝජනා උල්ලංඝනය කරලා දැන් බදු දාලා තිබෙනවා hybrid carsවලට, trishawsවලට සියයට 30ත්, 35ත් අතර. එක පැත්තකින් ජනතාවට සෙතක් ලබා දෙනවා නම් ඇයි මේ වාගේ බදු වැඩි කරන්නේ? සිගරට්වලට, අරක්කුවලට තව බදු වැඩි කළාට කමක් නැහැ. නමුත් ඇයි ඔබතුමන්ලාගේ අය වැයෙන් ගෙනාපු අදහස්ම නැවත මාස තුනක් හතරක් යන්න ඉස්සර වෙලා ප්‍රතික්ෂේප කරන්නේ? මොකක්ද මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ තිබෙන ප්‍රතිපත්තිය?

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ප්‍රශ්නය යොමු වෙලා තිබෙන්නේ සිගරට් සහ මත්පැන් සඳහා. ඒ සඳහා අදාළ නැති ප්‍රශ්නයකට මම උත්තර දෙන්නට ලෑස්ති නැහැ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔබතුමා සිටින්නේ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ නොවෙයිද?

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
Hybrid වාහන සහ වාහන ගැන සිගරට් සම්බන්ධ ප්‍රශ්නයක් යටතේ අහන්න බැහැ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒ බදු දමන්නේ සංස්කෘතික අමාත්‍යාංශයද?

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
කොහේද යන්නේ මල්ලේ පොල් වාගේ තමයි. ඒ වාගේ අහන ප්‍රශ්නවලට මේ ගරු සභාවේ උත්තර දෙන්න අපට හැකියාවක් නැහැ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
දෙවන අතුරු ප්‍රශ්නය.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
එහෙම නම් අදක්ෂ ඇමතිවරු තියා ගෙන ඉන්නේ මොකද?

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
අදාළ නැති ප්‍රශ්න අහන කොට ඒ වාගේ උත්තර තමයි අදක්ෂයින්ට දෙන්න ඕනෑ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
එවැනි ප්‍රශ්න අහන්න ඕනෑ සංස්කෘතික අමාත්‍යාංශයෙන්ද?

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, එතුමා උත්තර දෙන්න බැහැ කිව්වා නේ. ඔබතුමා දැන් දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, - [බාධා කිරීමක්]

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
කිලිනොච්චි යනවාය කියලා මැදවච්චි ගියා කියලායි කිව්වේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔබතුමා නියෝජනය කරන ආණ්ඩුවේ ඇමතිවරු සිය ගණනක් ඉන්නවා. අපි මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයෙන් ප්‍රශ්නයක් ඇසුවාම කියනවා, "උත්තර දෙන්න බැහැ" කියලා.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දත්ත 326ක උත්තරක් මේ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මේ ප්‍රශ්නය අහන්න වෙන්නේ සංස්කෘතික අමාත්‍යාංශයෙන්ද, එහෙම නැත්නම් ප්‍රවාහන අමාත්‍යාංශයෙන්ද?

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
මෙකේ දත්ත 326ක් අඩංගුයි.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ගරු නියෝජ්‍ය ඇමතිතුමා - [බාධා කිරීම්]

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
Ask about cigarettes.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
හිටපු ගරු නියෝජ්‍ය කථානායකතුමාට තිබෙන හදිසිය මොකක්ද? අද වැස්ස නිසා දුවන්න හදනවාද? අපි ප්‍රශ්න අහන්නේ ජනතාව වෙනුවෙන්. අද පාර්ලිමේන්තු රැස්වීම් තියන්න ඕනෑ දවසක්.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ඒ වාගේම අග්‍ර විනිශ්චයකරු ඉදිරිපත් කරලා තිබෙනවා දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්බන්ධයෙන් රටට ලොකු ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවාය කියලා. මුදල් කොමිසම පිහිටුවා තිබෙන්නේ දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ. දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ තිබෙන ප්‍රශ්නය සම්බන්ධයෙන් අග්‍ර විනිශ්චයකරු කියලා තිබෙන දේ අනුව මුදල් කොමිසමේ තිබෙන ප්‍රශ්නය මුදල් අමාත්‍යාංශයට බලපාන නිසා ඒ ගැන සංශෝධනයක් කිරීම සම්බන්ධයෙන් උත්තරයක් ලබා දෙනවාද කියලා අපි අහනවා.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
අදාළ නැහැ. ඒක හරියට නැව් ගිල්ල ප්‍රශ්නයක් වාගේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔබතුමාට මොනවාද අදාළ? මුදල් අමාත්‍යාංශයෙන් මෙහෙයවන්නේ නැති -

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
ඒක ලලිත් ඇතුලත්මුදලි ඇමතිතුමාගේ කාලයේ නැව් ගිල්ල ප්‍රශ්නයක් වාගේ එකක් තමයි. [බාධා කිරීම්] කවුද නැව් ගිල්ලේ කියලා ඇහුවොත් ඒකට උත්තරය දෙන්නම්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඇයි හම්බන්තොට නැව් ගිලලාද?

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
සතොස කෑවේ කවුද කිව්වොත් ඒකටත් උත්තර දෙන්නම්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
තුන්වැනි අතුරු ප්‍රශ්නය.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
බෝඩ් ගලවා ගෙන යන්න වෙන්නේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
තුන්වැනි අතුරු ප්‍රශ්නය.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
අදාළ නැත.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔය පැත්තේත් ඉන්නවා. මේ පැත්තේත් ඉන්නවා. උත්තර දෙන්න බැරි ප්‍රශ්න තමයි තිබෙන්නේ. තුන්වැනි අතුරු ප්‍රශ්නය මෙයයි. Gallup Poll එක යටතේ අද වාර්තා වෙලා තිබෙනවා, ශ්‍රී ලාංකිකයන්ගෙන් සියයට 95ක් ඉතාමත් අමාරු ජීවිතයක් ගත කරනවාය කියලා. මුදල් අමාත්‍යාංශයේ තිබෙන අදක්ෂතාව නිසා මෙය සිදු වෙලා තිබෙනවාය කියන එක ඔබතුමන්ලා පිළිගන්නවාද? නැත්නම් මේකත් අදාළ නැද්ද?

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ලංකාවේ හැම සතොසකම මත්පැන් විකුණන්නට පැය 24ක් තුළ එකම ගැසට් නිවේදනයකින් බලය ලබා දුන්නා. මත් පැන් පිළිබඳව අහපු ප්‍රශ්නයට අදාළව මම නැවත වරක් ඒ අදාළ ගැසට් පත්‍රය **සභාගත*** කරනවා.

කායිර්ෂාස්ප් නාරිමන් චොක්සි මුදල් අමාත්‍යවරයා විසින් 2003 පෙබරවාරි 27 වැනි දින හැම සුපර් මාර්කට් එකකම මත්පැන් විකුණන්න එකම ගැසට් නිවේදනයකින් නියම කළේ මේ ඇමතිතුමන්ලා හිටපු කැබිනට් එකෙන්ය කියන ටික මා මතක් කරන්න කැමැතියි.

අද ඇසුවේ මත්පැන් ගැනයි. මත්පැන් ගැනයි. "මතට තිත" ගැනයි. එතුමන්ලාගේ ආණ්ඩුව යටතේ මුළු ලංකාවේම මත්පැන් විකුණන්න පැය විසි හතරෙන් ඉඩ දුන්නා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි බොහොම අගය කරනවා, එතුමා කිව්වා, චොක්සි හිටපු ඇමතිතුමා අත්සන් කර තිබෙනවාය; මම ඒක කළාය කියා. අපි අහනවා "මතට තිත" තුළින් ඔබතුමන්ලා එය අවලංගු කරනවාද කියා. ගරු නියෝජ්‍ය ඇමතිතුමා උත්තර දුන්නා, චොක්සි හිටපු ඇමතිතුමා ඒක නීතිගත කළාය කියා. "මතට තිත" යටතේ මේ ආණ්ඩුව -ගරු අගමැතිතුමාත් දැන් මෙතැන ඉන්නවා.- ඒ සංශෝධන වහාම ඉවත් කරනවාද කියා කරුණාකරලා අපට උත්තර දෙන්න. [බාධා කිරීම්]

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
ඊට අමතරව එක පර්මිට් එකක්වත් අපි නිකුත් කළේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

---

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
නියෝජ්‍ය ඇමතිතුමා, ප්‍රශ්නයෙන් පැනලා යන්න හදන්න එපා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, අතුරු ප්‍රශ්න තුන අවසානයි.

ප්‍රශ්න අංක 15 -1028/'10- (1), ගරු සජිත් ප්‍රේමදාස මහතා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා ඒ ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මම ඒ ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## මහ නැඟුම යන්ත්‍රෝපකරණ හා ඉදිකිරීම් සමාගමේ සභාපතිවරයා: විස්තර

மகநெகும இயந்திர உபகரணங்கள், நிர்மாணக் கம்பனியின் தவிசாளர்: விபரம்

CHAIRMAN OF MAGA NEGUMA MACHINERY AND CONSTRUCTION COMPANY: DETAILS

0715/'10

2. **ගරු රවි කරුණානායක මහතා (ගරු දයාසිරි ජයසේකර මහතා වෙනුවට)**
(மாண்புமிகு ரவி கருணாநாயக்க - மாண்புமிகு தயாசிறி ஜயசேகர சார்பாக )
(The Hon. Ravi Karunanayake on behalf of the Hon. Dayasiri Jayasekara)
වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) මහ නැගුම යන්ත්‍රෝපකරණ හා ඉදි කිරීම් සමාගමේ සභාපතිවරයා පත් කළ බලධාරියා කවුරුන්ද;
(ii) එම සභාපතිවරයාගේ වයස කොපමණද;
(iii) ඔහු මෙයට පෙර සේවය කළ ස්ථානය හා තනතුර කවරේද;
(iv) ඔහුගේ වෘත්තීය පළපුරුද්ද කවරේද;
යන්න එතුමා සඳහන් කරන්නෙහිද?
(ආ) නො එසේ නම්, ඒ මන්ද?

துறைமுகங்கள், நெடுஞ்சாலைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மகநெகும இயந்திர உபகரணங்கள், நிர்மாணக் கம்பனியின் தவிசாளரை நியமித்த அதிகாரி யாரென்பதையும்,
(ii) குறித்த தவிசாளரின் வயது யாதென்பதையும்,
(iii) இவர் இதற்கு முன்னர் பணியாற்றிய இடம் மற்றும் பதவிகள் யாதென்பதையும்,
(iv) இவரின் தொழில் சார் அனுபவம் யாதென்பதையும்
அவர் குறிப்பிடுவாரா?
(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Ports and Highways:
(a) Will he state -
(i) the person in authority who appointed the current Chairman of the Maga Neguma Machinery and Construction Company;
(ii) the age of the above-mentioned Chairman;
(iii) his previous place of work and the position he held there; and
(iv) the professional experience he has acquired?
(b ) If not, why?

**ගරු නිර්මල කොතලාවල මහතා (වරාය හා මහාමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல - துறைமுகங்கள், நெடுஞ்சாலைகள் பிரதி அமைச்சர்)
(The Hon. Nirmala Kotalawala - Deputy Minister of Ports and Highways)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වරාය හා මහාමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை:*
** Answer tabled:*

(අ) (i) ලේකම් - මහාමාර්ග අමාත්‍යාංශය
(ii) 2010.11.23 වන දිනට වයස අවුරුදු 41
(iii) මෙයට පෙරද මහ නැගුම මාර්ග ඉදි කිරීම් යන්ත්‍රෝපකරණ සමාගමේ සභාපති ධුරය දරා ඇත.
(iv) ව්‍යාපාරික, දීර්ඝ කාලීනව ව්‍යාපාරික ක්ෂේත්‍රයේ ලබා ගත් පළපුරුද්දක් ඇත.
(ආ) පැන නොනඟී.

## දැදුරු ඔය ජලාශ ව්‍යාපෘතිය: ප්‍රගතිය

தெதுறு ஓயா நீர்த்தேக்கக் கருத்திட்டம்: முன்னேற்றம்

DEDURU OYA RESERVOIR PROJECT: PROGRESS

0968/'10

4. **ගරු රවි කරුණානායක මහතා (ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා වෙනුවට)**
(மாண்புமிகு ரவி கருணாநாயக்க - மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா சார்பாக )
(The Hon. Ravi Karunanayake on behalf of the Hon. Gamini Jayawickrama Perera)
වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (2):

(අ) (i) දැදුරු ඔය ජලාශ ව්‍යාපෘතියේ වත්මන් ප්‍රගතිය කවරේද;

(ii) මෙම යෝජනා ක්‍රමය යටතේ ජලය ලබා දෙන ප්‍රදේශ කවරේද;

(iii) මෙම යෝජනා ක්‍රමය යටතේ ජල විදුලි බලාගාරයක් ඉදි කරනු ලබන්නේද;

(iv) එසේ නම්, එහි විදුලි ජනන ධාරිතාව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) යාපහුව ආසනය තුළ ඇති කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ වැව් සංඛ්‍යාව කොපමණද;

(ii) එම වැව්වලට ඉහත යෝජනා ක්‍රමය යටතේ ජලය ලබා දෙන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

நீர்ப்பாசன, நீர்வள முகாமைத்துவ அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) தெதுறு ஓயா நீர்த்தேக்கக் கருத்திட்டத்தின் தற்போதைய முன்னேற்றம் யாதென்பதையும்,

(ii) இத்திட்டத்தின் கீழ் நீர் வழங்கப்படும் பிரதேசங்கள் யாவையென்பதையும்,

(iii) இத்திட்டத்தின் கீழ் நீர்மின்சக்தி நிலையமொன்று நிர்மாணிக்கப்படுமா என்பதையும்,

(iv) ஆமெனில், அதன் பிறப்பாக்க இயலளவு யாதென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) யாப்பஹுவ தொகுதியில் காணப்படும் சிறிய மற்றும் நடுத்தர அளவிலான குளங்களின் எண்ணிக்கை எவ்வளவென்பதையும்,

(ii) அக்குளங்களுக்கு மேற்படி திட்டத்தின் கீழ் நீர் வழங்கப்படுமா என்பதையும்,

அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Irrigation and Water Resources Management:

(a) Will he inform this House-

(i) the progress of the Deduru Oya Reservoir Project at present;

(ii) the names of the areas to which water is provided under this scheme;

(iii) whether a hydro power plant will be constructed under this scheme; and

(iv) if so, its electricity generating capacity?

(b) Will he state-

(i) the number of small and medium-scale tanks in the Yapahuwa Electorate; and

(ii) whether those tanks will be provided with water from the aforesaid scheme?

(c) If not, why ?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை:*
** Answer tabled:*

(අ) (i) භෞතික ප්‍රගතිය - සියයට 50
ප්‍රධාන බැම්ම - සියයට 90, ඇළ මාර්ග - සියයට 20
මූල්‍යමය ප්‍රගතිය - සියයට 50

(ii)

| | |
|---|---|
| වම් ඇළ | - හෙක්. 2,400 |
| දකුණු ඇළ | - හෙක්. 1,000 |
| රදවි බැඳි ඇළින් දැනට වගා කර ඇති ප්‍රමාණය | - හෙක්. 210 |
| අලුතින් වගා කළ හැකි ප්‍රමාණය | - හෙක්. 400 |
| ඉහිනිමිටිය ජලාශය මඟින් දැනට වගා කර ඇති ප්‍රමාණය | - හෙක්. 2,640 |
| තබ්බෝව වැව මඟින් දැනට වගා කර ඇති ප්‍රමාණය | - හෙක්. 865 |
| මාගල්ල වැව මඟින් දැනට වගා කර ඇති ප්‍රමාණය | - හෙක්.2,400 |
| අලුතින් වගා කර ඇති ප්‍රමාණය | - හෙක්. 600 |
| උස්සාන වාරිමාර්ග ක්‍රමය යටතේ වම් ඇළ | - හෙක්. 300 |
| උස්සාන වාරිමාර්ග ක්‍රමය යටතේ දකුණු ඇළ | - හෙක්. 300 |

(iii) ඔව්.

(iv) මෙගා වොට් 15.

(ආ) (i) 250-300 පමණ.

(ii) නැත.

(ඇ) දැදුරු ඔය ජලාශය මඟින් මෙම වැව්වලට ජලය සැපයීම අපහසුය. නමුත් පොම්ප කිරීම මඟින් ජාතීය ජල පහසුකම් සැපයිය හැක.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 6 -1007/'10- (2), ගරු අකිල විරාජ් කාරියවසම් මහතා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු අකිල විරාජ් කාරියවසම් මහතා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මම ඒ ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 9 -0717/'10- (2), ගරු දයාසිරි ජයසේකර මහතා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු දයාසිරි ජයසේකර මහතා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු පියංකර ජයරත්න මහතා (සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා)**
(மாண்புமிகு பியங்கர ஜயரத்ன - சிவில் விமானச் சேவைகள் அமைச்சர்)
(The Hon. Piyankara Jayaratne - Minister of Civil Aviation)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## මොරගහකන්ද ජලාශ යෝජනා ක්‍රමය: ජලය ලබා දෙන ප්‍රදේශ
## மொரகஹகந்த நீர்த்தேக்க கருத்திட்டம்: நீர் வழங்கப்படும் பிரதேசங்கள்
## MORAGAHAKANDA RESERVOIR PROJECT : WATER SUPPLY AREAS

0969/'10

11. **ගරු රවි කරුණානායක මහතා (ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා වෙනුවට)**
(மாண்புமிகு ரவி கருணாநாயக்க- மாண்புமிகு காமினி ஜயவிக்கிரம பெரேரா சார்பாக)
(The Hon. Ravi Karunanayake on behalf of the Hon.Gamini Jayawickrama Perera)

වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) මොරගහකන්ද ජලාශ ව්‍යාපෘතිය යටතේ ජලය ලබා දෙන ප්‍රදේශ කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) මෙම යෝජනා ක්‍රමය යටතේ දඹුල්ල හරහා මී ඔය ඔස්සේ යාපහුව හා ගල්ගමුව ප්‍රදේශවලට ජලය ගෙන ඒමට සැලසුම් කර තිබූ බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) යාපහුව හා ගල්ගමුව ප්‍රදේශවලට ජලය ලබා දීමට වෙනත් ක්‍රමවේදයක් ඉදිරිපත් කරන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නො එසේ නම්, ඒ මන්ද?

நீர்ப்பாசன, நீர்வள முகாமைத்துவ அமைச்சரைக் கேட்ட வினா:

(அ) மொரகஹகந்த நீர்த்தேக்க கருத்திட்டத்தின் கீழ் நீர் வழங்கப்படும் பிரதேசங்கள் யாவையென்பதை அவர் குறிப்பிடுவாரா?

(ஆ) இத்திட்டத்தின் கீழ் தம்புள்ளை ஊடாக மீ ஓயா மூலம் யாப்பஹுவ மற்றும் கல்கமுவ பிரதேசங்களுக்கு நீரைக்கொண்டு செல்வதற்கு திட்டமிடப்பட்டிருந்த தென்பதை அவர் ஏற்றுக்கொள்கின்றாரா?

(இ) யாப்பஹுவ மற்றும் கல்கமுவ பிரதேசங்களுக்கு நீரைப் பெற்றுக்கொள்வதற்கு வேறு வழிமுறையொன்று சமர்ப்பிக்கப்படுமா என்பதனை அவர் குறிப்பிடுகிறாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Irrigation and Water Resources Management:

(a) Will he state the areas to which water is supplied under the Moragahakanda Reservoir Project?

(b ) Will he admit that it had been planned to supply water to Yapahuwa and Galgamuwa areas under this scheme by channelling water from the aforesaid reservoir along Mee Oya via Dambulla?

(c) Will he state whether some other way of supplying water to Yapahuwa and Galgamuwa areas will be submitted?

(d) If not, why ?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை:*
** Answer tabled:*

(අ) මහවැලි සංවර්ධන වැඩසටහන යටතේ එහි ප්‍රධාන සැලසුමේ හා උප ව්‍යාපෘතීන්හි වූ ප්‍රධාන අංශයක් වන මොරගහකන්ද ජලාශ ව්‍යාපෘතියෙහි වැඩ අවසන් වූ විට ශ්‍රී ලංකාවේ ජල හිඟ උතුරු මැද, උතුර, නැගෙනහිර හා වයඹ යන ප්‍රදේශවලට එමඟින් ජලය සැපයේ.

මහින්ද චින්තන ප්‍රතිපත්ති ප්‍රකාශනය යටතේ මේ සම්බන්ධව දැනටමත් ක්‍රියා මාර්ග ගෙන ඇත.

(ආ) 1968 එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන් අධ්‍යයන වාර්තාවේ එම ප්‍රදේශයට ජලය හැරවීම සැලකිල්ලට ගෙන නොතිබුණ ද, විවිධ පාර්ශ්වවල ඉල්ලීම් මත දඹුල්ල හරහා මී ඔය මඟින් හෝ කලා වැව වම් ඉවුර ඇළ විශාල කිරීමෙන් සහ දීර්ඝ කිරීමෙන් ජලය යාපහුවට හෝ ගල්ගමුවට ගෙන යෑමට සැලසුම් සැකසී තිබුණි.

(ඇ) දැනට මෙම ප්‍රදේශයට ජලය සැපයීමට වෙනත් ක්‍රමයක් සැලකිල්ලට භාජනය කරන්නේ නැත.

(ඈ) පැන නොනඟී.

## පොල්තවාන-ගොරකදෙණිය මාර්ගය: තාර දැමීම
## பொல்தவான-கொரகதெனிய வீதி : தாரிடல்
## POLTAWANA-GORAKADENIYA ROAD: TARRING

0727/'10

14. **ගරු රවි කරුණානායක මහතා (ගරු දයාසිරි ජයසේකර මහතා වෙනුවට)**
(மாண்புமிகு ரவி கருணாநாயக்க - மாண்புமிகு தயாசிறி ஜயசேகர சார்பாக)
(The Hon. Ravi Karunanayake on behalf of the Hon. Dayasiri Jayasekara)

වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) පඩුවස්නුවර බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පොල්තවාන, ගොරකදෙණිය මාර්ගය අයත් වන ආයතනය කවරේද;

(ii) එම මාර්ගයට තාර දැමීම සඳහා අදාළ ආයතනයෙන් අවසර ලබා ගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද;

(ආ) (i) එම මාර්ගයට තාර දැමීම භාර දුන් ආයතනය හෝ පුද්ගලයන් කවුරුන්ද;

(ii) ඒ සඳහා වෙන් කළ ඇස්තමේන්තු ගත මුදල කොපමණද;

(iii) එම ඇස්තමේන්තුව අනුව තාර දැමීම සිදු කළ යුතු දුර ප්‍රමාණය හා පාරේ පළල කොපමණද;

(iv) මේ වන විට තාර දමා ඇති දුර ප්‍රමාණය කොපමණද;

(v) තාර දැමීම අවසන් කළ දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) එම මාර්ගයට තාර දැමීම ප්‍රමිතියට අනුකූලව සිදු කර නොමැති බව සහ නියමිත දුර ප්‍රමාණය නොමැති බව එතුමා දන්නෙහිද?

(ඈ) එසේ නම්, ප්‍රමිතීන්ට අනුකූල නොවන ඉදි කිරීම් කළ ආයතනය හෝ පුද්ගලයන් සම්බන්ධයෙන් ගන්නා ක්‍රියා මාර්ගය කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නො එසේ නම්, ඒ මන්ද?

துறைமுகங்கள், நெடுஞ்சாலைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) பண்டுவஸ்நுவர மேற்கு பிரதேச செயலாளர் பிரிவின் பொல்தவான கொரகதெனிய வீதி எந்த நிறுவனத்திற்கு உரித்தாகின்றது என்பதையும் ,

(ii) மேற்படி வீதிக்கு தார் இடுவதற்காக உரிய நிறுவனத்தின் அனுமதி பெறப்பட்டுள்ளதா என்பதையும்

அவர் இச் சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) மேற்படி வீதிக்கு தார் இடுவதற்காக ஒப்படைக்கப்பட்ட நிறுவனம் அல்லது நபர்கள் யாரென்பதையும்,

(ii) அதற்காக ஒதுக்கப்பட்ட மதிப்பீட்டுத் தொகை எவ்வளவென்பதையும்,

(iii) குறித்த மதிப்பீட்டுக்கமைய தாரிட வேண்டிய தூரத்தின் அளவும் வீதியின் அகலமும் எவ்வளவென்பதையும்,

(iv) தற்போது தாரிடப்பட்டுள்ள தூரத்தின் அளவு எவ்வளவென்பதையும்,

(v) தாரிட்டு முடித்த திகதி யாது என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(இ) மேற்படி வீதிக்கு தாரிடுதல் தரநியமங்களுக்கமைய நடைபெறவில்லை என்பதையும், தற்போது பெரும்பாலான இடங்கள் ஆழ்ந்துள்ளன என்பதையும், உரிய தூரத்திற்கு தாரிடப்படவில்லை என்பதையும் அவர் அறிவாரா?

(ஈ) ஆமெனின், தரநியமங்களுக்கு இணங்கியொழுகாத வகையில் நிர்மாணிப்பை மேற்கொண்ட நிறுவனம் அல்லது நபர்கள் தொடர்பில் மேற்கொள்ளும் நடவடிக்கைகள் யாவை என்பதை அவர் இச்சபையில் அறிவிப்பாரா?

(உ) இன்றேல், ஏன்?

asked the Minister of Ports and Highways:

(a) Will he inform this House-

(i) of the institution under which the Polthawana Gorakadeniya Road in Panduwasnuwara West Divisional Secretariat Division comes ; and

(ii) whether permission has been obtained from the relevant institution to tar that road?

(b) Will he state-

(i) the name of the institution or names of the persons entrusted with the task of tarring the aforesaid road ;

(ii) the estimated amount of money allocated in that respect ;

(iii) the length and width of the road to be tarred, according to that estimate ;

(iv) the length of the stretch of road that has been tarred by now ; and

(v) the date on which tarring was completed?

(c) Is he aware that tarring of that road has not been done conforming to the standards many places have cared in by now and that the specified length has not been tarred?

(d) If so, will he inform this House of the measures that will be taken against the institution or persons that carried out constructions without conforming to the standards?

(e) If not, why?

**ගරු නිර්මල කොතලාවල මහතා**
(மாண்புமிகு நிர்மல கொத்தலாவல)
(The Hon. Nirmala Kotalawala)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වරාය හා මහාමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

***සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை:*
** Answer tabled:*

(අ) (i) පඬුවස්නුවර ප්‍රාදේශීය සභාව.

(ii) යම් මාර්ගයක් සංවර්ධනය කිරීමේ අවශ්‍යතාව හඳුනා ගත් විට ඊට ප්‍රමුඛතාව ලබා දී කටයුතු කරනු ලැබේ.

(ආ) (i ) මග නැගුම මාර්ග ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ සමාගම.

(ii) රුපියල් මිලියන 06.

(iii) දිග කිලෝමීටර් 1.2

පළල අඩි 11-12.

(iv) දිග කිලෝමීටර් 1.2

(v) 2009 දෙසැම්බර්.

(ඇ) මාර්ගය පිළිසකර කිරීම නියමිත ප්‍රමිතියට සිදු කර ඇති බව වාර්තා කර ඇත.

(ඈ) අදාළ නොවේ.

(ඉ) අදාළ නොවේ.

## පනත් කෙටුම්පත් පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட சட்டமூலங்கள்
## BILLS PRESENTED

### පළිබෝධ නාශක පාලනය කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත
### பீடைகொல்லிகளைக் கட்டுப்படுத்தல் (திருத்தம்) சட்டமூலம்
### CONTROL OF PESTICIDES (AMENDMENT) BILL

"1980 අංක 33 දරන පළිබෝධ නාශක පාලනය කිරීමේ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

***පිළිගන්වන ලද්දේ කෘෂිකර්ම අමාත්‍යතුමා වෙනුවට ගරු දිනේෂ් ගුණවර්ධන මහතා විසිනි.***

***2011 මැයි 04 වන බදාදා දෙවන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද නියෝග කරන ලදී.***

*கமத்தொழில் அமைச்சர் சார்பாக மாண்புமிகு தினேஷ் குணவர்தன அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.*

*2011 மே 04, புதன்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் கட்டளையிடப்பட்டது.*

*Presented by the Hon. Dinesh Gunawardena on behalf of the Minister of Agriculture; to be read a Second time upon Wednesday, 04th, May, 2011 and to be printed.*

## පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්
## தனி உறுப்பினர் சட்டமூலங்கள்
## PRIVATE MEMBERS' BILLS

### ශ්‍රී ලංකා ධීවර හා ජලජ සම්පත් සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
### கடற்றொழில், நீர்வாழ், உயிரின வளங்களுக்கான இலங்கை அவை (கூட்டிணைத்தல்) சட்டமூலம்
### SRI LANKA ASSOCIATION FOR FISHERIES AND AQUATIC RESOURCES (INCORPORATON) BILL

**ගරු වික්ටර් ඇන්ටනි මහතා**
(மாண்புமிகு விக்டர் அந்தனீ)
(The Hon.Victor Antony)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "ශ්‍රී ලංකා ධීවර හා ජලජ සම්පත් සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතු ය."

**ගරු විජිත බේරුගොඩ මහතා**
(மாண்புமிகு விஜித பேருகொட)
(The Hon. Vijitha Berugoda)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.***

***පනත් කෙටුම්පත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.***

***වාර්තා කිරීම සඳහා 47(5) වන ස්ථාවර නියෝගය යටතේ පනත් කෙටුම්පත ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා වෙත පවරන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக் கொள்ளப்பட்டது.*

*இதன்படி, சட்டமூலம் முதன்முறை மதிப்பிடப்பட்டு, அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*

*சட்டமூலம் நிலைக் கட்டளை இல. 47 (5)இன்படி கடற்றொழில், நீரக வளமூலங்கள் அபிவிருத்தி அமைச்சருக்கு அறிக்கை செய்யப்படுதற்காகச் சாட்டப்பட்டது.*

*Question put, and agreed to.*

*Bill accordingly read the First time, and ordered to be printed.*

*The Bill stood referred, under Standing Order No. 47(5), to the Minister of Fisheries and Aquatic Resources Development for report.*

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

මී ළඟට, යෝජනා පිළිබඳ දැනුම් දීම සහ අද දිනට නියමිත කටයුතු.

සේවානියුක්තයන්ගේ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අරමුදල් පනත් කෙටුම්පත දෙවන වර කියවීම.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, න්‍යාය පත්‍රයේ අංක 1, 2, 3, 4 යටතේ සඳහන් පනත් කෙටුම්පත් අද දින විවාදයට ගැනීමට නියමිතව තිබුණත්, ඔබතුමා විසින් මෙම ගරු සභාව ආරම්භයේදී කියවන ලද නිවේදනය අනුව ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ තිබෙන පෙත්සම නිසා අද දින විවාදයට ඒවා ඉදිරිපත් නොකරන බව මා දැනුම් දෙන්නට කැමැතියි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

අද දින පස් වරු 3.00ට ගරු කථානායකතුමාගේ නිල කාමරයේදී පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව රැස්වීමට නියමිතය. එයට සහභාගි වන ලෙස සියලුම සභික මන්ත්‍රීවරුන්ගෙන් මා කාරුණිකව ඉල්ලා සිටිනවා.

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்துவைக்கப்பெற்றது.*
*Question proposed.*

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව ඉදිරිපත් කිරීම, ගරු අජිත් කුමාර මහතා.

### පාසල් නිල ඇඳුම් රෙදි කඩිනමින් ලබා දීම
### பாடசாலை சீருடைத் துணிகளைத் துரிதமாகப் பெற்றுக்கொடுத்தல்
### IMMEDIATE PROVISION OF SCHOOL UNIFORM MATERIAL

**ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සභාව කල් තබන අවස්ථාවේ මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "රජය මඟින් පාසල් සිසුන්ට ලබා දිය යුතු, නොමිලයේ ලබා දෙන පාසල් නිල ඇඳුම් 2011 වර්ෂයේ පළමුවන වාරය අවසන් වී තිබුණ ද, රටේ බොහෝ පාසල් ප්‍රමාණයකට මේ වන විටත් එම නිල ඇඳුම් ලැබී නැත. එසේම නිල ඇඳුම් ලබා දුන් ඒවාද ප්‍රමිතියෙන් බාල තත්ත්වයේ හා නිල ඇඳුමකට සුදුසු නොවන තත්ත්වයේ වේ.
>
> මේ කරුණු සලකා බලා 2011 වසර සඳහා දැනට රට පුරා පාසල් නිල ඇඳුම් ලබා දීමේදී නිල ඇඳුම් ලබා දුන් පාසල් ප්‍රමාණය හා සිසුන් ප්‍රමාණය පිළිබඳ සමාලෝචනයක් ඉදිරිපත් කරන ලෙසටත්, 2 වන පාසල් වාරය ඇරඹීමට පෙරවත් ශ්‍රී ලංකාවේ සියලු පාසල් සිසුන්ට නිල ඇඳුම් ලබා දෙන ලෙසටත් මෙම ගරු සභාවට යෝජනා කර සිටී."

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා මෙම යෝජනාව ඉදිරිපත් කළේ දෙවන පාසල් වාරය ආරම්භ වීමට ප්‍රථමයෙන්. ඒ නිසා මෙම යෝජනාවේ "දෙවන පාසල් වාරය ඇරඹීමට පෙරවත්" කියන කොටස වෙනුවට, "දෙවන පාසල් වාරය ආරම්භ වූ සැණින් හෝ ඒ පිළිබඳව සමාලෝචනය කර නිල ඇඳුම් ලබා දෙන ලෙසට යෝජනා කර සිටිමි" යනුවෙන් සංශෝධනය කරන ලෙසත් මා ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි දන්නවා මේ රටේ පාසල් ශිෂ්‍යයන්ට ලැබුණු අයිතියක් විධියට පසු ගිය කාලය පුරාම ඔවුන්ට නිල ඇඳුම් ලබා දුන් බව. විශේෂයෙන්ම අද මේ රටේ ජීවත් වීමේ අරගලයක යෙදී සිටින දෙමවුපියන්ට, දරුවන්ට අධ්‍යාපනය ලබා දීම සඳහා විශාල වෙහෙස මහන්සියක් ගන්නා දෙමවුපියන්ට, එම අධ්‍යාපනය සඳහා වන වැය බරත්, ජීවත් වීමේ බරත් නිසා පීඩනයට පත්ව සිටින දෙමවුපියන්ට රජය වග කීමක් විධියට මේ නිල ඇඳුම් ලබා දීමෙන් යම් සහනයක් ලැබෙනවා. නමුත් පසු ගිය අවුරුදු කිහිපයක් පුරාම මේ නිල ඇඳුම් ලබා දීමේ ක්‍රියාවලියේ විවිධ ගැටලු, අඩු පාඩුකම් තිබුණා. අපි දන්නවා, බොහෝ පාසල් දරුවන්, ඒ වාගේම ඔවුන්ගේ දෙමවුපියන් මේ නිල ඇඳුම් ලැබෙන තුරු බලා ගෙන සිටින බව. මොකද, ඔවුන්ගේ අධ්‍යාපනය සඳහා වැය වන වියදමේ අධික බවත්, ජීවන වියදමේ අධික බවත් නිසා රජය මඟින් ලබා දෙන නිල ඇඳුම ඔවුන්ට යම් අස්වැසිල්ලක් වුණා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. නමුත් පසු ගිය අවුරුදු කිහිපය පුරාම මේ නිල ඇඳුම් ලබා දීමේ දී විවිධ ගැටලු, අක්‍රමිකතා, ඒ වාගේම පමාවීම් වැනි ප්‍රශ්න ගණනාවකට මුහුණ දෙන්නට සිදු වුණා. ඒ ප්‍රශ්න එක්ක වෙච්ච සාකච්ඡාවලදී අදහස් වුණේ, මේ නිල ඇඳුම් ලබා දීම නිසි ප්‍රමිතියෙන්, ඒ වාගේම නිසි කාල සීමාවේ දී නිසි වේලාවට සිදු විය යුතුය කියන එකයි. නමුත් පසු ගිය අවුරුදුවලටත් වඩා මේ 2011 වසරේ දී නිල ඇඳුම් ලබා දීමේ බරපතළ ගැටලුකාරී තත්ත්වයකට මේ රටේ පාසල් සිසුන් මුහුණ දී තිබෙනවා. මේ පිළිබඳව විවිධ මාධ්‍යවලින් විවිධ සාකච්ඡා මඟිනුත්, ඒ වාගේම මේ පාර්ලිමේන්තුව තුළත් සාකච්ඡා වුණා. විශේෂයෙන් ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා මේ නිල ඇඳුම් ගැන වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්නයකුත් මේ ගරු සභාවට යොමු කරලා තිබුණා. එතුමාත් අද මේ ගැන කථා කරයි කියලා මා හිතනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ නිල ඇඳුම් ලබා දීම සම්බන්ධයෙන් විශේෂයෙන්ම අපි විශ්වාස කරන පළමුවන කාරණාව තමයි ජනවාරි මාසයට කලින් දෙසැම්බර් මාසයේවත් මේ නිල ඇඳුම් ලැබෙන්නට ඕනෑය කියන එක. ඇත්ත වශයෙන්ම පාසල් වාරය පටන් ගත්තාට පසුව නිල ඇඳුම් ලැබීමෙන් ඵලක් නැහැ. ජනවාරි මාසයේ ලැබිලා ඵලකුත් නැහැ. දෙසැම්බර් මාසයේ අගදීවත් ලැබෙන්නට ඕනෑ. මේක ඒ තරම් ගැටලුවක් නොවෙයි. මොකද, සියලුම දිස්ත්‍රික්ක මට්ටමෙන්, කලාප මට්ටමෙන්, පාසල් මට්ටමෙන් නිල ඇඳුම් ලබා දිය යුතු ප්‍රමාණය මොකක්ද කියලා වාර්තාවක් අධ්‍යාපන අමාත්‍යාංශය සතුව, දෙපාර්තමේන්තුව සතුව තිබෙනවා. එහෙම වාර්තාවක් සකස් කර ගන්න බැරි වෙලා තිබෙනවා නම් එය එම අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තුවල තිබෙන අඩු පාඩුවක්. මා හිතන හැටියට ඒ පිළිබඳව ඒ අමාත්‍යාංශයේ ගරු ඇමතිතුමන්ලාගේ අවධානය යොමු විය යුතුයි.

මේ කාර්යය අමාරු දෙයක් නොවෙයි. ලබා දිය යුතු නිල ඇඳුම, නිල ඇඳුමේ ප්‍රමාණය කොපමණද, ඒ සඳහා යන වියදම කොපමණද, ගෙන්වන්නේ කොහොමද කියන එක ගැන සැලැස්මක් රජයට තිබිය යුතුයි. ඒ වාගේම අය වැය ඉදිරිපත් කිරීමේදී ඒ වැය ශීර්ෂවලිනුත් මේ සඳහා මුදල් වෙන් කරලා තිබෙන බව අපි දන්නවා. නිල ඇඳුම් ලබා දිය යුතුයි කියා රජය පිළිගෙන තිබෙනවා. ඒ පිළිගැනීමත් එක්ක මේ සඳහා මුදල් ප්‍රතිපාදන වෙන් කරලා තිබෙනවා. එහෙම මුදල් ප්‍රතිපාදන වෙන් කරලා තිබෙනවා නම්, ඒ වාගේම ලංකාවේ නිල ඇඳුම් ලබා දිය යුතු ශිෂ්‍යයන් ප්‍රමාණය කොපමණද කියා තක්සේරුවක්, ඇස්තමේන්තුවක් තිබෙනවා නම් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒක ප්‍රශ්නයක් වන්නේ නැහැ. ඒක කරන්න පුළුවන් දෙයක්. එහෙම නම් අපි -

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

Order, please! මෙම අවස්ථාවේදී, ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මන්ත්‍රීතුමාගේ නම මූලාසනය සඳහා යෝජනා කරන්න.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

"ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා මූලාසනාරූඪ විය.***
*அதன் பிறகு, பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத் தினின்று அகலவே, மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* MR. DEPUTY SPEAKER *left the Chair, and* THE HON. ALHAJ A.H.M. AZWER *took the Chair.*

**ගරු අජිත් කුමාර මහතා**
(மாண்புமிகு அஜித் குமார)
(The Hon. Ajith Kumara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වර්ෂයේ නිල ඇඳුම් ලබා දිය යුතු ශිෂ්‍යයන් ප්‍රමාණය කොපමණද කියා තක්සේරුවක් කර ගන්න පුළුවන්. ඒ සඳහා ප්‍රතිපාදන වෙන් කරලාත් තිබෙනවා. එහෙම නම් මේ නිල ඇඳුම පමා වන්නේ ඇයි?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන් නිල ඇඳුම් ගෙන්වීමට භාර ගත් ආයතන එම නිල ඇඳුම් ගෙන්වීමේදී ඔවුන්ට සිදු වුණු අපහසුතාවන් පිළිබඳ ප්‍රශ්නයක් පසු ගිය දවස්වල මාධ්‍යවල පළ වුණු බව අපි දැක්කා. පාසල් ශිෂ්‍යයන් පිළිබඳව ඇස්තමේන්තු කළාට පස්සේ, ඒ සඳහා යන වියදම ඇස්තමේන්තු කරලා මුදල් ප්‍රතිපාදන වෙන් කළාට පස්සේ, ඒ අමාරුම වැඩ ටික කළාට පස්සේ රජයට අඩුම ගණනේ මේ රෙදි ටික ගෙන්වා ගන්න බැරිද කියා අපි දැන ගන්න කැමැතියි. එහෙම නම් මෙය කළමනාකරණයේදී, සැලසුම් කිරීමේදී, මේ පිළිබඳව අධීක්ෂණය කිරීමේදී, පසු විපරම් කිරීමේදී ගැටලුවක් වෙලා තිබෙනවාය කියන එක ඉතාම පැහැදිලියි.

මා මේ යෝජනාව ඉදිරිපත් කළේ පළමුවන පාසල් වාරය අවසන් වන්නට කලිනුයි. අද වන කොට දෙවන පාසල් වාරයත් ආරම්භ කරලා තිබෙනවා. 25 වන දායි, දෙවන පාසල් වාරය පටන් ගත්තේ. නමුත් අපි දන්නා විධියට දෙවන පාසල් වාරය ආරම්භ වෙලා තිබියදී මේ වන විටත් ශිෂ්‍යයන් විශාල ප්‍රමාණයකට නිල ඇඳුම ලැබිලා නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි දන්නවා, පාසල් වාරය ආරම්භ කරන කොටම අලුත් ඇඳුමක් ඇඳ ගෙන යන්න අපේ දරුවන් ඉතාම කැමැතියි කියලා. මේකෙන් එක පැත්තකින් ඇඳුමක් ගන්න පුළුවන් කෙනාටත් ප්‍රශ්නයක් ඇති වනවා. මොකද, නිල ඇඳුම ලැබෙනවාය කියන කල්පනාවේ ඉඳලා, නිල ඇඳුම ලැබෙනවාය කියන සහතිකයේ ඉඳලා ඒ අය නිල ඇඳුම් මිල දී ගත්තේ නැහැ.

ඒ නිසා බොහෝ සිසුන් පාසල් නිල ඇඳුම හැටියට ඇඳ ගෙන ගියේ පරණ නිල ඇඳුම බව අපි දන්නවා. දෙවැනි වාරය ආරම්භ

[ගරු අජිත් කුමාර මහතා]

කරලාවත් මේක ලැබිලා නැහැ. ඒ නිසා වහාම මේ සම්බන්ධයෙන් මැදිහත් වෙන්නය කියා ඒ අමාත්‍යවරුන්ගෙන්, ඒ වාගේම රජයෙන් මා ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

ඒ වාගේම අපි දැක්කා ඒ ලබා දීපු නිල ඇඳුම් රෙදි ප්‍රමිතියෙන් ඉතාම බාල ඒවා බව. ඒ වාගේම ඒ ලබා දිය යුතු නිල ඇඳුමේ වර්ණයට වඩා වෙනස් බාල වර්ගයේ නිල ඇඳුම් රෙදි තමයි ලබා දී තිබුණේ. මේ පාර්ලිමේන්තුවේදීත් ඒ පිළිබඳව කථා කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට ඒ පිළිබඳව සාක්ෂි ඉදිරිපත් කරන්න පුළුවන්. ඒ නිසා මා ඉල්ලීමක් කරනවා මේ සම්බන්ධයෙන් වහාම රජයේ මැදිහත් වීමක් කරලා මේ නිල ඇඳුම් ලබා දීමේදී ඇති වුණු ගැටලුව විසඳන්නය කියා. ඒ වාගේම මේ ප්‍රමිතියෙන් බාල නිල ඇඳුම් රෙදි ගෙන්වීම පිළිබඳ විශේෂ පරීක්ෂණයක් කරන්නය කියාත් ඉල්ලනවා.

ගාල්ල දිස්ත්‍රික්කයේ රිච්මන්ඩ් විද්‍යාලය, මහින්ද විද්‍යාලය, විද්‍යාලෝක විද්‍යාලය ඇතුළු පාසල් ගණනාවකටත්, මහනුවර දිස්ත්‍රික්කයේ කිංස්වුඩ් විද්‍යාලය, සුමංගල විද්‍යාලය, විද්‍යාර්ථ විද්‍යාලය යන විද්‍යාලවලටත්, කුරුණෑගල දිස්ත්‍රික්කයේ ශාන්ත ආනා විද්‍යාලය, මලියදේව විද්‍යාලය, වාරියපොල ඤාණෝදය විද්‍යාලය යන විද්‍යාලවලටත්, අම්පාර දිස්ත්‍රික්කයේ පදියතලාව ජාතික පාසල, මහඔය කැප්පෙටිපොළ මහා විද්‍යාලය, අම්පාර ඩී.එස්. සේනානායක ජාතික පාසල ආදී පාසල් ගණනාවකටත්, ඒ වාගේම රත්නපුර දිස්ත්‍රික්කයේ කලවාන ජාතික පාසල, සීවලී මධ්‍ය මහා විද්‍යාලය, සුමනා බාලිකා විද්‍යාලය, ශාන්ත ඇලෝසියස් විද්‍යාලය ඇතුළු පාසල් ගණනාවකටත් මේ වන විටත් පාසල් නිල ඇඳුම් රෙදි ලැබිලා නැහැ. ඒ නිසා මා ඉතාම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා අද මේ රටේ තිබෙන ජීවන වියදමේ බරත්, විශේෂයෙන්ම අධ්‍යාපනයේ තිබෙන තරගකාරීකම නිසා ඇති වී තිබෙන බරත්, මේ ප්‍රශ්න නිසාත් බරපතළ අමාරුවක වැටිලා ඉන්න මේ දරුවන්ට රජය විසින් ලබා දිය යුතු, ඒ වාගේම මුදල් ප්‍රතිපාදන වෙන් කර තිබෙන ඒ නිල ඇඳුම් රෙදි මේ දෙවැනි වාරය ආරම්භයේදීවත් ලබා දෙන්නට කඩිනමින් කටයුතු කරන්නය කියා. ඒ වාගේම ප්‍රමිතියෙන් බාල නිල ඇඳුම් රෙදි ලබා දීම පිළිබඳව පරීක්ෂණයක් කරලා ඒ සම්බන්ධව මේ පාර්ලිමේන්තුවටත් වාර්තාවක් ඉදිරිපත් කරන්න කියලාත් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. ඒ වාගේම මේ වන විට ලංකාවේ පාසල් සිසුන්ට ලබා දෙන නිල ඇඳුම් රෙදි පිළිබඳව යම් සමාලෝචනයක් ඉදිරිපත් කරන ලෙසත් රජයේ පාර්ශ්වයෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. බොහොම ස්තුතියි.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගාල්ල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු අජිත් කුමාර මහතා සභාව කල් තබන අවස්ථාවේදී මේ උත්තරීතර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරපු යෝජනාව ස්ථිර කරන අතරේම මම සඳහන් කරන්නට අවශ්‍යයි මුලින්ම මේ දුන්නු නිල ඇඳුම් රෙදිවල ප්‍රමිතිය පිළිබඳව මීට සති කිහිපයකට කලින් මේ ගරු සභාවේදී මා ප්‍රශ්න කළ බව. ඒ නිල ඇඳුම් කට්ටලයේ රෙදි කැල්ලක් ගෙනැල්ලා පෙන්නුවාම අද මූලාසනයේ ඉන්න ඔබතුමා ඇහුවා මේ සභාවට මේ රෙදි ගෙනාවේ කොහොමද කියලා. මම මේ ගරු සභාවෙන් පිට වෙලා යන්න හදන කොට මන්ත්‍රී පිවිසුම අසල ඉන්න පොලිස් නිලධාරින්ට දැඩි ගැටලුවකට මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙනවා මම දැක්කා. ඒ අය එදා මගෙන් පුනපුනා ඇහුවා, කොහොමද ඒ රෙදි කැල්ල ගෙනාවේ කියලා. මම කිව්වා ඒක මගේ වෙට්ටියට තියලා ඔතා ගෙන ආවේ කියලා. ඒ අවස්ථාවේ එතැන හිටපු ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරි මහත්මයෙක් කිව්වා, "නැහැ, ඔබතුමා සභාවේදී ඉටි කොළ පැකට් එකක් කඩලා මේක ගන්නවා අපි රූපවාහිනී යන්ත්‍රවලින් දැක්කා" කියලා. මම කිව්වා, "නැහැ, මේ සභාවට ඇවිල්ලා අපේ ඇඳුම් අඳින කාමරයේදී තමයි මම ඒක ආපහු ඉටි කොළ පැකට් එකට දැම්මේ" කියලා. කියන්න කනගාටුයි, බාල රෙදි ගෙන්නපු අය ගැන හෙව්වේ නැහැ. එම බාල රෙදි පාසල්වලට දෙන්න කලින් ඒ කටයුත්ත කළේ කවුද කියන එක හෙව්වේ නැහැ. මේ ගරු සභාවට ඒ රෙදි කැල්ල ගෙනෙන්න මම කටයුතු කිරීම පිළිබඳ වගකීම අහිංසක පොලිස් නිලධාරින්ගේ පිටින් යවලා, ඒ අයට දඬුවම් කරන ක්‍රමයක් පිළිබඳව කල්පනා කළා විනා, ඒකට ක්‍රමවේද හැදුවා විනා, බාල රෙදි දීපු එක ගැන බැලුවේ නැහැ. ප්‍රමිතියෙන් තොර වූ මේ නිල ඇඳුම් රෙදි ගැන මම එදා ඉතා පැහැදිලිව කිව්වා. ගරු උසස් අධ්‍යාපන ඇමතිතුමනි, පාසල් යන අවුරුදු 13-16 අතර ශිෂ්‍යාවකට නොවෙයි, අඩුම ගණනේ ශිෂ්‍යයකුටවත් අඳින්න බැරි රෙදි තමයි මේ දීලා තිබෙන්නේ. මාතර දිස්ත්‍රික්කයේ මුලටියන අධ්‍යාපන කලාපයේ පාසල්වලට දීපු එක රෙදි කැල්ලක් ගෙනැල්ලා පෙන්වූවාට පස්සේ ඊ ළඟ දවසේ මට දුරකථන ඇමතුම් ආවා, මාතර දිස්ත්‍රික්කයේ පමණක් නොවෙයි, ලංකාවේ තවත් බොහෝ දිස්ත්‍රික්කවල මේ විධියේ ප්‍රමිතියෙන් බාල පාසල් නිල ඇඳුම් රෙදි දීලා තිබෙනවා කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ සිද්ධ වුණු දේ වුණා. එහෙම නම් මේ වෙච්ච සිද්ධිය පිළිබඳව පරීක්ෂණ පවත්වනවාට අමතරව, ඒ වැරැදිකරුවන් පිළිබඳව තීන්දු ගන්නවාට අමතරව, ලබන අවුරුද්දේ පාසල් නිල ඇඳුම් ලබා දෙන්න කටයුතු කරද්දී එක පැත්තකින් ප්‍රමිතියට අදාළ ගුණාත්මකභාවයෙන් යුතු පාසල් නිල ඇඳුම් රෙදි හතළිස්ලක්ෂයකට අධික අපේ පාසල් දරුවන්ට දෙන ගමන් එම නිල ඇඳුම් රෙදි නියම කලට වේලාවට පාසල් දරුවන්ට සැපයීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ අවධානය යොමු වෙන්නට ඕනෑ. එය අධ්‍යාපන අමාත්‍යාංශයේ බලධාරින්ගේ මෙන්ම අමාත්‍යතුමා, නියෝජ්‍ය අමාත්‍යතුමා, ලේකම්තුමා ප්‍රමුඛ සියලු දෙනාගේම වග කීමක්.

අද මූලාසනයේ ඉන්න ඔබතුමාත් එදා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු විධියට කටයුතු කරපු කාලයේ, රණසිංහ ප්‍රේමදාස ජනාධිපතිතුමාගේ යුගයේ 1993 අවුරුද්දේ තමයි මුලින්ම නිල ඇඳුම් කට්ටල රෙදි දුන්නේ. එදා පාසලේ උසස් පෙළ ශිෂ්‍යයකු විධියට හිටපු මමත් නිල ඇඳුම් රෙදි කට්ටලයක් ලබපු කෙනෙක්. 1993 දීයි මම උසස් පෙළ විභාගයට පෙනී සිටියේ. ඒ ලබපු නිල ඇඳුම් රෙදි කට්ටලය තමයි මගේ ජීවිතයේ මම ලබපු ප්‍රථම සහ එකම නිල ඇඳුම් රෙදි කට්ටලය. 1993න් පසු මට පාසලෙන් සමු ගන්න සිද්ධ වුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එදා ප්‍රමිතියෙන් යුක්ත නිල ඇඳුම් රෙදි දුන්නා; කලට වේලාවට නිල ඇඳුම් රෙදි දුන්නා. අද වෙලා තිබෙන්නේ මොකක්ද? පාසල් පෙළ පොත් ටික කලට වේලාවට ලබා දීමේත් ගැටලු ඇති වෙලා තිබෙනවා. නිල ඇඳුම් රෙදි කට්ටලය කලට වේලාවට දීමේත් ගැටලු ඇති වෙලා තිබෙනවා. නිල ඇඳුම් රෙදි කට්ටලය කලට වේලාවට විතරක් නොවෙයි ප්‍රමිතියට දෙන්න බැරි තත්ත්වයට පත් වෙලා තිබෙනවා. එහෙම නම් කවුද මේකට වග කිව යුත්තේ? ඇයි නිලධාරින්ට බැරි ලබන වර්ෂයට අවශ්‍ය ඇඳුම් ප්‍රමාණ පිළිබඳව කල් වේලා ඇතිව කාල සටහනක්, කාල රාමුවක් හදා ගන්න? එහෙමයි සැලසුම් කරන්න ඕනෑ. ලබන අවුරුද්දට පාසල්වල මෙපමණ ශිෂ්‍ය සංඛ්‍යාවක් ඉන්නවා, ඒ අයට මෙපමණ නිල ඇඳුම් රෙදි කට්ටල ප්‍රමාණයක් අවශ්‍ය වෙනවා, ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා මෙපමණ සංඛ්‍යාවක් ඉන්නවා එතුමන්ලාට මෙපමණ රෙදි කට්ටල ප්‍රමාණයක් අවශ්‍ය වෙනවා කියලා සැලසුම් කරන්න ඕනෑ. සමහර තැන්වලට දීලා තිබෙන්නේ සුදු කොට කලිසමකට රෙදි නොවෙයි, කළු කොට කලිසමකට රෙදි. එකම පාසලේ සමහර ළමයින්ට හම්බ වෙලා තිබෙනවා, කොට කලිසමට නිල් පාට රෙදි. සමහර ළමයින්ට හම්බ වෙලා තිබෙනවා කළු පාට රෙදි. දැන් මේවා පිළිබඳව පරීක්ෂණ කරන්න ඕනෑ වාගේම ලබන වර මෙහෙම නොවන්න කටයුතු කිරීමත් වැදගත්ය කියන එක මා මතක් කරනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒක හරි වැදගත්.

ඒ වාගේම සමහර පාසල්වල සුදු කොට කලිසම් සහ සුදු දිග කලිසම් සඳහා ඒ දීපු රෙදිවලින් පිරිමි ළමයින්ට කලිසම් මැහුවොත් අපට මතක් වෙන්නේ අර එක්තරා යුගයක කථා කරපු "ගණ්ටාර මාක්" සරොම් ගැනයි. ඒ නිසා මේ රෙදිවල ප්‍රමිතිය පිළිබඳව කථා කරන්න අවශ්‍යයි. ඇත්ත, මේ වෙලාවේ ආණ්ඩුවට අවංක චේතනාවක් තිබෙන්න ඇති විදේශ රටවලින් මේ රෙදි ආනයනය කරනවාට වඩා දේශීය කර්මාන්තකරුවා නඟා සිටුවන්න, දේශීය රෙදි නිෂ්පාදකයාට අත් වැලක් වෙන්න මේ රෙදි දේශීය කර්මාන්තකරුවන්ගෙන්, දේශීය නිෂ්පාදකයන්ගෙන්, දේශීය සැපයුම්කරුවන්ගෙන් ගන්න. චේතනාව හොඳයි. චේතනාව පිළිබඳව අබ මල් රේණුවකවත් අපේ විවේචනයක් නැහැ. දේශීය කර්මාන්තකරුවා ශක්තිමත් කරන්න ඕනෑ; දේශීය නිෂ්පාදකයා ශක්තිමත් කරන්න ඕනෑ; දේශීය සැපයුම්කරුවාට ශක්තියක් වෙන්න ඕනෑ. ඒ ගැන අබ මල් රේණුවකවත් අපේ තර්කයක් නැහැ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. හැබැයි අපේ ප්‍රශ්නය තිබෙන්නේ මේ පිළිබඳව තිබෙන පසු විපරම සම්බන්ධයෙනුයි.

දේශීය කර්මාන්තකරුවාට, නිෂ්පාදකයාට මේ කටයුත්ත භාර දුන්නාම ඔහු ප්‍රමිතියෙන් යුක්ත නිෂ්පාදනයක් ලබා නොදෙනවා නම් දේශීය කර්මාන්තකරුවා, නිෂ්පාදකයා සහ සැපයුම්කරුවා ශක්තිමත් කිරීමේ රජයේ බලාපොරොත්තුව බිඳ වැටෙනවා විතරක් නොවෙයි මේ රටේ හතළිස්ලක්ෂයක් පාසල් දරුවන්ටත්, ඔවුන්ගේ දෙමවුපියන්ටත් "සිරිලක දේ සිරි සැප දේ" කියන සංකල්පය උල්ලංඝනය වීම තුළ ඇති වන්නේ මොන වාගේ හැඟීමක්ද? අපි දන්නවා සමහර අය දේශීයත්වයට වඩා පරදේශීයත්වයට බොහොම ආසයි කියා. ටිකක් හොඳට හැදිච්ච හරක් නාම්බෙක් හිටියොත් ඌට රට වස්සා කියන්න සමහරු කැමැතියි. හොඳට වැවුණු තණ කොළ ටිකක් තිබුණොත් රට තණ කොළ කියනවා. මේ රට දේ හොඳයි කියන හැඟීමක් ඇති කරන්න, දේශීය කර්මාන්තකරුවා ශක්තිමත් කරන්න බාල රෙදි දුන්නාය කියලා, ඒ බාල රෙදි අර ගත්තාට පසුව, ඒවා දැක්කාම ඇති වන්නේ "අනේ අපොයි! පාසල් දරුවන්ට ලැබෙන දේශීය නිෂ්පාදනය මෙහෙමද" කියන හැඟීමක්. හතළිස්ලක්ෂයක් දරුවෝ කියලා කියන්නේ ආසන්න වශයෙන් හතළිස්ලක්ෂයක් පවුල්වලට අයිති දරුවන්. එක ගෙදරකින් ඉස්කෝලේ යන දරුවෝ දෙන්නා තුන් දෙනා ඉන්න පුළුවන්. අපි දළ වශයෙන් සැලකුවොත් තිස්ලක්ෂයක් පවුල්වලට මේ රටේ ආණ්ඩුව මොකක්ද දෙන පණිවුඩය? ඒ දෙන පණිවුඩය තමයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දේශීය නිෂ්පාදකයාට ගුණාත්මකභාවයෙන් යුත් රෙදි නිෂ්පාදනය කිරීමේ හැකියාවක් නැහැ කියන එක. එහෙම නම් මම කියනවා, ආණ්ඩුව මේ ගැන වැඩියෙන් පරීක්ෂණ කරන්න ඕනෑ කියලා. ඇයි, සමහර විට ආණ්ඩුවේ චින්තනය අනුව මේ තුළ විදේශ කුමන්ත්‍රණයක් තිබුණා වෙන්න පුළුවන්; මේ තුළ ආණ්ඩුව අප්‍රසාදයට පත් කිරීමේ විදේශීය කුමන්ත්‍රණයක් තිබුණා වෙන්න පුළුවන්. එහෙම නම් ඒ අර්ථයෙන් බැලුවත් පරීක්ෂණ කරලා මේ ගැන සොයා බැලීම ඉතා වැදගත් වනවා.

මම කනගාටු වෙනවා, මේ ගැන කථා කරන මේ මොහොතේදී අධ්‍යාපන ඇමතිතුමාත්, නියෝජ්‍ය අධ්‍යාපන ඇමතිතුමාත් මේ සභාවේ නැති එක ගැන. ඒ ගැන කවුරු හෝ වග කිව යුතු අමාත්‍යවරයෙක් කථා කරන්න ඉඩ තිබෙනවා. නමුත් ප්‍රශ්නය තිබෙන්නේ මේකයි. එදා මම මේ පිළිබඳව ප්‍රශ්න කළ වෙලාවේ ඒ මම ගෙනාව රෙදි කැබැල්ල ගරු නියෝජ්‍ය අධ්‍යාපන ඇමතිතුමා මේ පාර්ලිමේන්තුවේ -අපේ සභා ගර්භයේ- වැඩ කරන සේවක මහත්මයෙක් මගින් ඉල්ලා ගත්තා. මේ සභාවට රෙදි ගෙනාපු එක ගැන විරෝධය පළ කළ ඔබතුමාත් ඊ ළඟ දවසේ මට කිව්වා, "ඇත්ත පුතා, ඒ රෙදි කෑල්ල එච්චර quality නැහැ. මටත් ඒක තේරුණා." කියලා. හැබැයි ඒ රෙදි කැබැල්ල අරගෙන දැන් මාසයකට කිට්ටු වෙන්න එනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
**(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)**
(The Presiding Member)
ගරු ඇමතිතුමාත් ඒක පිළිගත්තා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
**(மாண்புமிகு புத்திக பதிரண)**
(The Hon. Buddhika Pathirana)
ඇමතිතුමා ඉතා පැහැදිලිව පිළිගත්තා. හැබැයි මාසයක් වෙන්න එනවා. අපට තවම උත්තරයක් නැහැ. අද මම අධ්‍යාපනය සම්බන්ධව ප්‍රශ්න කිහිපයක් මතු කළ වෙලාවේ, අතුරු ප්‍රශ්නයක් විධියට හෝ මේ ගැන අහන්න හිටියා. අවාසනාවකට අදත් අධ්‍යාපන අමාත්‍යතුමායි, නියෝජ්‍ය අමාත්‍යතුමායි නැහැ. ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා කිව්වා සාධාරණ උත්තරයක් දෙන්න කල් ගන්න ඕනෑ කියලා. ඒ නිසා මම කියනවා, මේක බරපතළ ප්‍රශ්නයක් කියා. ලෙනින් කිව්වා, "හොඳම දේ දරුවන්ට" කියා. අද හොඳම දේ දරුවන්ට ලැබෙනවාද කියන ප්‍රශ්නය මේ තුළින් ඇති වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු අජිත් කුමාර මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු කල් තැබීමේ යෝජනාව ස්ථිර කරන අතරම මේ ගැන මේ සභාවේ අවධානය යොමු කරවනවා. වෙලාවට නිල ඇඳුම් රෙදි දෙන්න බැරි තත්ත්වය ඇති වීමට බලපෑවේ කුමක්ද, ඒ සඳහා වග කිව යුතු නිලධාරින් කවුද, ඒ සඳහා වග කිව යුතු දේශපාලන නායකයෝ ඉන්නවා නම් ඒ කවුද, පළාත් අධ්‍යාපන බලධාරින් ඉන්නවා නම් ඒ කවුද, පළාත් අධ්‍යාපනය සම්බන්ධව දේශපාලන අධිකාරියේ යම් අය ඉන්නවා නම් ඒ කවුද කියන කාරණා පිළිබඳව හොයා බලා පරීක්ෂණයක් කර හතළිස්ලක්ෂයකට ආසන්න අහිංසක පාසල් දරුවන්ගේ නාමයෙන්, රටේ අනාගතයේ නාමයෙන් මේ සම්බන්ධයෙන් ක්‍රියා මාර්ගයක් ගත යුතුයි කියන එක අවධාරණය කරනවා. අවසාන වශයෙන් අවධාරණය කරන දෙවන කාරණාව මේකයි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
**(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)**
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, මෙහිදී දේශීය නිෂ්පාදකයන් පිළිබඳව අඩු තක්සේරුවක් කරන්න පුළුවන්ද?

**ගරු බුද්ධික පතිරණ මහතා**
**(மாண்புமிகு புத்திக பதிரண)**
(The Hon. Buddhika Pathirana)
නැහැ. ඒක මගේ කථාවේදී පැහැදිලිව කිව්වා. ඔබතුමා මගේ කථාවට ඇහුම් කන් දුන්නා නම් ඇහෙන්න ඉඩ තිබුණා. මා ඒකයි කිව්වේ. මේ තුළින් දේශීය නිෂ්පාදකයා අඩු තක්සේරුවකට ලක් කර තිබෙනවා. කවුද ලක් කර තිබෙන්නේ? මේ ගැන පසු විපරම් කළ අය. දැන් හතළිස්ලක්ෂයක් පාසල් දරුවන්ගේ දෙමව්පියන්ට ඇති වන ආකල්පය මොකක්ද? "අයියෝ! අපේ රටේ නිෂ්පාදන බාලයි" කියන එකයි. ඒකයි මා කිව්වේ, මේ පිටුපස ආණ්ඩුව අපහසුතාවට පත් කිරීමේ ජාත්‍යන්තර කුමන්ත්‍රණයක් තිබෙනවාද කියා සොයා බලන්න කියලා. ඒක සොයා බලන්න ඕනෑ. බැන් කී මුන්ගේ වාර්තාව විතරක් නොවෙයි. මේකත් ඒ වාගේම බරපතළ ප්‍රශ්නයක්. මේක, ඒවාට දෙන තැනම දිය යුතු බරපතළ ප්‍රශ්නයක්.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
**(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)**
(The Presiding Member)
ඒ දෙකම සම කරනවාද? ඒ ප්‍රශ්නයයි මේ ප්‍රශ්නයයි දෙක සම කරලාද කථා කරන්නේ?

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා සඳහන් කරන දෙවන කාරණය මේකයි. ලබන වසරේ මෙහෙම දෙයක් ඇති නොවන්න, අනාගතයේ මෙහෙම තත්ත්වයක් ඇති නොවන්න අවශ්‍ය ක්‍රියා මාර්ග ගත යුතුයි. "අඳුරට සාප කරකර සිටිනවාට වඩා එක පහනක් හෝ දැල්වීම වටියි" කියන චීන කියමන උපුටා දක්වමින් වුණු වැරැද්දට අවශ්‍ය ක්‍රියා මාර්ග ගන්න ගමන් යළිත් වැරැද්දක් නොවන්න අවශ්‍ය ක්‍රියා මාර්ග ගත යුතුයි කියන එක මේ හතළිස්ලක්ෂයකට වැඩි පාසල් දරුවෝ වෙනුවෙන් යුක්තිය හා සාධාරණත්වයේ නාමයෙන් ඉල්ලමින් ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු යෝජනාව මා ස්ථිර කරමින් මගේ අදහස් ස්වල්පය සමාප්ත කරනවා. බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Is there a reply from the Hon. Minister?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා විසින් මේ පිළිබඳ විස්තරාත්මක පිළිතුරක් මී ළඟ පළමුවන පාර්ලිමේන්තු දිනයේදී දීමට කටයුතු කරන බව ප්‍රකාශ කරන්න කැමැතියි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 1.57ට, 2011 මැයි 03 වන අඟහරුවාදා අ. භා. 1.00 වන තෙක් කල් ගියේය.***

*அதன்படி பி. ப. 1.57 மணிக்கு பாராளுமன்றம், 2011 மே 03, செவ்வாய்க்கிழமை பி. ப. 1.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*Adjourned accordingly at 1.57 p.m. until 1.00 p.m. on Tuesday, 03rd May, 2011.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

குறிப்பு

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to be Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts**
**Received from Parliament :**

**Printed copies dispatched :**

දායක මුදල් : පාර්ලිමේන්තු විවාද වාර්තාවල වාර්ෂික දායක මිල රු. 2178කි. පිටපතක් ගෙන්වා ගැනීම අවශ්‍ය නම් ගාස්තුව රු. 18.15කි. තැපැල් ගාස්තුව රු. 2.50කි. කොළඹ 6, කිරුළපන, පාමංකඩ පාර, අංක 102, පියසිරි ගොඩනැගිල්ලේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම නොවැම්බර් 30 දාට ප්‍රථම දායක මුදල් ගෙවා ඉදිරි වර්ෂයේ දායකත්වය ලබා ගෙන විවාද වාර්තා ලබාගත හැකිය. නියමිත දිනෙන් පසුව එවනු ලබන දායක ඉල්ලුම් පත් භාර ගනු නොලැබේ.

**சந்தா ;** ஹன்சாட் அதிகார அறிக்கையின் வருடாந்த சந்தா ரூபா 2,178. ஹன்சாட் தனிப்பிரதி ரூபா 18.15. தபாற் செலவு ரூபா 2.50. வருடாந்த சந்தா முற்பணமாக **அத்தியட்சகர், அரசாங்க வெளியீட்டலுவலகம், இல. 102, பியசிறி கட்டிடம், பாமன்கடை வீதி, கிருளப்பனை, கொழும்பு 6** என்ற விலாசத்திற்கு அனுப்பி பிரதிகளைப் பெற்றுக்கொள்ளலாம். ஒவ்வோராண்டும் நவம்பர் 30 ஆந் தேதிக்கு முன் சந்தாப்பணம் அனுப்பப்பட வேண்டும். பிந்திக் கிடைக்கும் சந்தா விண்ணப்பங்கள் ஏற்றுக்கொள்ளப்படமாட்டா.

**Subscriptions :** The annual subscription for Official Report of Hansard is Rs. 2,178. A single copy of Hansard is available for Rs. 18.15. (Postage Rs. 2.50) Copies can be obtained by remitting in advance an annual subscription fee to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, No. 102,Piyasiri Building, Pamankada Road, Kirulapone, Colombo 6. The fee should reach him on or before November 30 each year . Late applications for subscriptions will not be accepted.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.